
# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව



ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ



# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ



**පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය**

**2011**

යාවත්කාලීන කිරීම - 2019

## ශ්‍රී ලංකාව

"පෙරදිග මුතු ඇටය" නම් විරුදාවලිය ලත් ශ්‍රී ලංකාව උතුරු අක්ෂාංශ $5^{0}55'$ සිට $9^{0}51'$ දක්වා ද, නැගෙනහිර දේශාංශ $79^{0}31'$ සිට $81^{0}53'$ දක්වාද විහිදෙමින් ලෝක සිතියමෙහි සිය පිහිටීම සනිටුහන් කරනුයේ කුඩා තිතක් වශයෙනි. එහි සමස්ත භූමි ප්‍රමාණය වර්ග කි. මී. 65,610 (වර්ග සැතපුම් 25,332)කි. ඉන් ගොඩබිම වර්ග කි. මී. 62,705ක්ද, අභ්‍යන්තර ජලාශ වර්ග කි. මී. 2,905ක්ද වේ. උතුරේ සිට දකුණට දුර ප්‍රමාණය කි. මී. 432 (සැ. 270)ක් හා වැඩිම පළලින් යුත් ස්ථානය නැගෙනහිර සිට බටහිරට කි. මී. 224 (සැ. 140)ක් වේ.

පරිපාලනමය වශයෙන් ශ්‍රී ලංකාව පළාත් 9කට බෙදා ඇති අතර, එය දිස්ත්‍රික්ක 25කින් සමන්විත වේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ පරිපාලන අග නගරය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ද, වාණිජ අග නගරය කොළඹ ද වේ.

2012 වසර මැද ඇස්තමේන්තු කළ මුළු ජනගහණය 20,359,439 කි. (මිලියන 20.359). ඉන් පිරිමි ජනගහණය 10,057,563, ගැහැණු ජනගහණය 10,505,471 ක් ද වේ.

අතීතයේ දී ශ්‍රී ලංකාව හඳුන්වන ලද්දේ "තම්බපණ්ණි" (මුල් ආර්ය පදිංචිකරුවන්), "සිංහලද්වීප" (සංස්කෘත සාහිත්‍යය), "සෙරන්ඩිබ්" (අරාබිවරුන්), "තැප්රොබේන්" (ග්‍රීක්වරුන්), "සෙයිලාවෝ" (පෘතුගීසින්), "සෙයිලාන්" (ලන්දේසින්), "සිලෝන්" (බ්‍රිතාන්‍ය ජාතිකයන්) යන විවිධ නම්වලිනි.



## ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ

බ්‍රිතාන්‍ය ජාතිකයන් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් වසර තිස් දෙකකට පසුව සහ මුලදී උඩරට රාජධානියත්, පසුව 1815 දී මුළු දිවයිනත් බ්‍රිතාන්‍ය පාලනයට යටත් කරනු ලැබූ එකඟතාව පිළිබඳ පනතක් වූ උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් වසර දොළහකට පසුව, දිවයිනේ පරිපාලන සහ අධිකරණ ක්‍රම සම්බන්ධයෙන් සිදුකළ යුතු ප්‍රතිසංස්කරණ පිළිබඳව වාර්තා කිරීමට ලුතිනන් කර්නල් ඩබ්ලිව්. ජී. එම්. කොල්බෲක් සහ චාල්ස්හේ කැමරන් යන අයගෙන් සැදුම්ලත් රාජකීය කොමිෂන් සභාවක් 1827 දී දිවයිනට පැමිණියේ ය.

එකිනෙකට වෙනස් වූ සභා දෙකක් පිහිටුවිය යුතු යැයි මෙම රාජකීය කොමිෂන් සභාව නිර්දේශ කළ අතර, ඉන් එක් සභාවක් විධායක සභාව වශයෙන් ද, අනෙක් සභාව ව්‍යවස්ථාදායක සභාව වශයෙන් ද හඳුන්වනු ලැබිණ.

එකී නිර්දේශ අනුව, මෙම සභා දෙක පිහිටුවීම සඳහා වූ බලය ආණ්ඩුකාර සර් රොබට් හෝර්ටන් වෙත පවරනු ලැබුයේ 1833 මාර්තු මස 19 වැනි දින IV වන විලියම් රජු නිකුත් කළ රාජකීය නියෝග මගිනි.

නිල ලත් සාමාජිකයන් නව දෙනෙකුගෙන් හා ආණ්ඩුකාරයා විසින් නම් කරන ලද යුරෝපීය ජාතිකයින් තිදෙනෙකුගෙන් ද සිංහල, දෙමළ සහ බර්ගර් ප්‍රජාවන් ගෙන් එක් අයකු බැගින් තවත් තිදෙනෙකුගෙන් ද සමන්විත වූ නිල නොලත් සාමාජිකයන් හය දෙනෙකුගෙන් ද ව්‍යවස්ථාදායක සභාව සමන්විත විය. ව්‍යවස්ථාදායක සභාවේ සභාපති වූයේ ආණ්ඩුකාරවරයා ය.

1912 දී, ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව විසි එක දක්වා වැඩි කරන ලද අතර, ඔවුන්ගෙන් දස දෙනෙක් නිල නොලත් අයවූහ. (ඔවුන්ගෙන් හය දෙනෙකු ආණ්ඩුකාරවරයා විසින් නම් කරනු ලැබිය යුතු වූ අතර අනෙක් හතර දෙනා තෝරා පත්කර ගනු ලැබිය යුතු වූහ.)

1921 දී හඳුන්වා දෙන ලද ප්‍රතිසංස්කරණ අනුව ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව තිස් හත දක්වා (නිල ලත් දහහතර දෙනෙකු සහ නිල නොලත් විසිතුන් දෙනෙකු වන පරිදි) වැඩි කරන ලදී. ආණ්ඩුකාරවරයා



විසින් නම් කරන ලද සිව් දෙනා අතුරින් දෙදෙනෙකු උඩරට සිංහල පිරිස නියෝජනය සඳහා වූ අතර, මුස්ලිම්වරුන් සහ ඉන්දියානුවන් නියෝජනයට එක් අයෙකු බැගින් පත් කෙරිණ. තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයන් 16 දෙනෙකු සිටි අතර, ඔවුන් අතුරින් 11 දෙනෙකු ප්‍රාදේශීය මැතිවරණ කොට්ඨාස අනුව තෝරා ගනු ලැබූ අතර, ජන වාර්ගික කොට්ඨාස පදනම මත යුරෝපීයයන් දෙදෙනෙකු සහ බර්ගර් ජාතිකයෙකු තෝරා පත් කර ගන්නා ලදී. යුරෝපීය වෙළෙඳ මණ්ඩලය සහ පහතරට නිෂ්පාදන සංගමය නියෝජනය කිරීම සඳහාද එක් අයෙකු බැගින් තෝරා පත් කර ගන්නා ලදී. විධායක සභාවට නිල නොලත් සාමාජිකයන් තිදෙනෙකු පත් කරන ලෙස ද නිර්දේශ කරන ලදී.

1924 දී ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකත්වය 49 දක්වා වැඩි කරන ලදී. නිල බලයෙන් පත් වූ පස් දෙනෙකුද, නම් කරන ලද හත් දෙනෙකු ද, වශයෙන් නිල ලත් දොළොස්දෙනෙක් වූහ. නිල නොලත් 37 දෙනා අතුරින් 23 දෙනෙකු ප්‍රාදේශීයව තෝරා පත් කර ගන්නා ලද අතර, 6 දෙනෙක් ජන වර්ගික පදනම මත (යුරෝපීයයන් තිදෙනෙකු, සිංහලයන් දෙදෙනෙකු බස්නාහිර පළාතේ ද්‍රවිඩයන් සඳහා එක් අයකු වශයෙන්) තෝරා පත් කර ගන්නා ලදහ. එසේම, මුස්ලිම් ජාතිකයන් සඳහා තිදෙනෙකු, ඉන්දියානු ජාතිකයන් සඳහා දෙදෙනෙකු සහ විශේෂ අවශ්‍යතා සඳහා තිදෙනෙකු වශයෙන් නම් කරන ලද සාමාජිකයෝ අට දෙනෙක් ද සභාවට ඇතුළත් වූහ.

1931 දී ඩොනමෝර් නිර්දේශයන් හඳුන්වා දීමත් සමගම, එකල "ලංකාව" නමින් හැඳින්වුණු ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය ලැබිණ. මෙම ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායක සභාව "රාජ්‍ය මන්ත්‍රණ සභාව" ලෙස නම්කරන ලද අතර; එය සාමාජිකයන් හැට එක් දෙනෙකුගෙන් සමන්විත විය. ඔවුන් අතර ප්‍රධාන ලේකම්, මුදල් ලේකම් සහ නීති ලේකම් නම් වූ රාජ්‍ය නිලධාරින් තිදෙනෙකු වූ අතර, 50 දෙනෙකු ප්‍රාදේශීයව මැතිවරණ කොට්ඨාස මට්ටමින් තෝරා ගනු ලැබූ අතර, අට දෙනෙකු ආණ්ඩුකාරවරයා විසින් නම් කෙරිණ. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබූ වැදගත් ලක්ෂණයක් වූයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවෙහි විධායක කාරක සභා කිහිපයක් තිබීම යි. අමාත්‍යවරයෙකු වශයෙන් කටයුතු කළ සභාපතිවරයෙක් එක් එක් කමිටුව මගින් තෝරා ගන්නා ලදී.

ඊළඟ වැදගත් සිදුවීම වූයේ අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සලකා බැලීම සඳහා 1944 දී සෝල්බරි කොමිෂන් සභාව පත් කිරීමයි. ඒ කොමිෂන් සභාවේ නිර්දේශ අනුව සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් වූ වෙස්ට්මින්ස්ටර් ආකෘතියේ ප්‍රතිසංස්කරණ යෝජනාවලියක් 1946 දී හඳුන්වා දෙන ලදී. ඒ අනුව පාර්ලිමේන්තුව සභා දෙකකින් සමන්විත විය. එනම්, සෙනේට් සභාව (උත්තර මන්ත්‍රී මණ්ඩලය) සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (පහළ මන්ත්‍රී මණ්ඩලය) යන සභා දෙක ය. සෙනේට් සභාවේ සාමාජිකයන් සංඛ්‍යාව 30ක් වූ අතර, එයින් 15 දෙනෙක් පහළ මන්ත්‍රී මණ්ඩලයෙන් පත් කරන ලද අතර, ඉතිරි සාමාජිකයෝ අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරන ලදහ. පහළ මන්ත්‍රී මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව 101ක් වූ අතර, ඉන් 95 දෙනෙක් සර්වජන ඡන්දයෙන් තෝරා පත් කර ගන්නා ලදහ. ඉතිරි 6 දෙනා අග්‍රාණ්ඩුකාරවරයා විසින් නම් කරන ලදහ. අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය පහළ මන්ත්‍රී මණ්ඩලයට වගකිවයුතු විය.

1948 පෙබරවාරි 04 වැනි දින ශ්‍රී ලංකාව නිදහස් රටක් බවට පත් විය. 1972 දක්වා වරින් වර සිදු කරන ලද වෙනස්කම් ද සහිතව, 1946 දී හඳුන්වා දුන් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක විය.

1971 ඔක්තෝබර් 02 වැනි දින සෙනේට් සභාව අහෝසි කරන ලදී.

1972 මැයි මස 22 වැනි දින නව ජන රජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කර ගනු ලැබූ අතර, එමගින් අග්‍රාණ්ඩුකාර ධුරය වෙනුවට ජනාධිපති ධුරය පිහිටුවන ලදී. ජනාධිපතිවරයා නාමමාත්‍ර රාජ්‍ය නායකයා වූ අතර, සැබෑ බලතල අග්‍රාමාත්‍යවරයා අත විය.

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය - එනම් ජාතික රාජ්‍ය සභාව - එක් සභාවකින් සමන්විත විය. ඡන්දයෙන් තේරී පත් වූ ජනතා නියෝජිතයන් 168 දෙනෙක් ඊට අයත් වූහ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978 දක්වා පැවතුණි.

දෙවන ජනරජ ව්‍යවස්ථාව වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978 සැප්තැම්බර් මස 7 වැනි දින බලාත්මක විය. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන සුවිශේෂ ලක්ෂණ වන්නේ සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම හා විධායක ජනාධිපති ක්‍රමය තහවුරු කිරීම යි.

මේ ව්‍යවස්ථාදායකය ද එක් සභාවකින් සමන්විත වූවකි. පාර්ලිමේන්තුව මන්ත්‍රීවරුන් 225 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් අතරින් 196 දෙනෙක් සමානුපාත ඡන්ද ක්‍රමය යටතේ තෝරා පත් කර ගනු ලැබේ. ඉතිරි 29 දෙනා, ජාතික මට්ටමින් අදාළ මහ මැතිවරණයේ දී ඒ ඒ දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ද ලබා ගන්නා ඡන්ද ප්‍රමාණය අනුව ඒ ඒ දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට ද හිමි වන 'ජාතික ලැයිස්තු' මන්ත්‍රී ධුර සංඛ්‍යාව අනුව, අදාළ මහ මැතිවරණ අපේක්ෂක ලැයිස්තුවෙන් පත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුව ව්‍යවස්ථාදායක බලය හිමි රටේ උත්තරීතර ආයතනය ලෙස සැලකේ. රටට අවශ්‍ය නීතිරීති පැනවීමේ බලය ඊට ඇත්තේ ය.

මහ මැතිවරණයෙන් පසු පාර්ලිමේන්තුව පළමු වරට රැස්වූ දින සිට සාවුරුද්දක් එහි නිල කාලය වේ. ජනාධිපති විසින් කලින් කළ ප්‍රකාශනයක් මගින් පාර්ලිමේන්තුව කැඳවීම, වාරාවසාන කිරීම කළ හැකි ය. ඒ හැරුණු විට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ද එතුමාට බලය ඇතත් මහ මැතිවරණයෙන් ඉක්බිති ව පත් වන පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයෙන් එය විසුරුවා හරින ලෙස ඉල්ලා සිටියහොත් මිස, ඒ මහ මැතිවරණය පැවැත්වූ දින සිට එක් අවුරුදු කාල සීමාවක් ඉකුත්වීම තෙක් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට නොහැක්කේ ය.

පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් (නොපැමිණි මන්ත්‍රීන් ද ඇතුළුව) 2/3කට වැඩි ඡන්දයෙන් හා ජනමත විචාරණයකින් අවශ්‍ය නම් පාර්ලිමේන්තු නිල කාලය තවත් දීර්ඝ කළ හැකි ය. එසේ නොවන්නේ නම් අවුරුදු 6 අවසානයේ දී එම පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද සේ සැලකේ.

## කොළඹ ගාලු මුවදොර පිහිටි පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල

ඉන්දියන් සාගරයට මුහුණලා ගාලු මුවදොර පිහිටි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල පාර්ලිමේන්තු රැස්වීම් සඳහා යොදා ගැනීමට පෙර, විධායක සභාවේ සහ ව්‍යවස්ථාදායක

සභාවේ රැස්වීම් පැවැත්වූයේ දැනට විදේශ කටයුතු අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන දර්ශනීය ගෝඩන් උද්‍යානය ඉදිරිපස පිහිටි ගොඩනැගිල්ලෙහි ය.

1930 ජනවාරි මස 29 වැනි දින ආණ්ඩුකාර ශ්‍රීමත් හර්බට් ස්ටැන්ලි මැතිතුමා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලද මේ ගොඩනැගිල්ලෙහි ව්‍යවස්ථාදායකයේ රැස්වීම් 1982 අප්‍රේල් මාසය දක්වා පවත්වන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවලින් ඉක්බිතිව ව්‍යවස්ථාදායකය හඳුන්වනු ලැබූ නාමය පහත දැක්වෙන පරිදි කිහිප වරක්ම වෙනස් කරන ලදී.

කමිටුවේ නිර්දේශය පරිදි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීන් සංඛ්‍යාව 101 සිට 157 දක්වා තව දුරටත් වැඩි කරන ලද අතර, ඒ සංඛ්‍යාව 1972 දක්වා පැවතුණි.

ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාව 1972 දී සම්මත වීමෙන් පසුව මන්ත්‍රීන් සංඛ්‍යාව 168 දක්වා වැඩි කරන ලදී. වැඩිවූ මන්ත්‍රීන් සංඛ්‍යාවට අවශ්‍ය ඉඩකඩ සලසා දීම සඳහා මේ හැම අවස්ථාවකදී ම ගොඩනැගිල්ලේ අවශ්‍ය වෙනස්කම් සිදු කරන ලදී. පාර්ලිමේන්තු පරිචයේ දී සම්ප්‍රදායන්ට වැදගත් ස්ථානයක් හිමි වන, එමෙන්ම හැම



කොළඹ ගාලු මුවදොර පිහිටි පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල

ව්‍යවස්ථාදායක සභාව (1833 - 1931); රාජ්‍ය මන්ත්‍රණ සභාව (1931 - 1947); නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (1947 - 1972); ජාතික රාජ්‍ය සභාව (1972 - 1978) සහ පාර්ලිමේන්තුව (1978 සිට) වශයෙනි.

ව්‍යවස්ථාදායක සභාව වශයෙන් මේ ගොඩනැගිල්ල විවෘත කරනු ලැබූ අවස්ථාවේ එහි සභා ගර්භයේ ආසන පහසුකම් තිබුණේ මන්ත්‍රීවරුන් 49 දෙනෙකුට පමණි.

1947 දී සෝල්බරි ව්‍යවස්ථාව හඳුන්වා දීමත් සමගම සභාවේ සාමාජික සංඛ්‍යාව 101 දක්වා වැඩි කරන ලදී. 1959 දී පත් කරන ලද මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ම සභා ගර්භයේ ආසනයක් වෙන් වී නැති බ්‍රිතාන්‍යයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මෙන් නොව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හැම මන්ත්‍රීවරයකුට ම සභා ගර්භය තුළ ආසනයක් ලබා දී ඇත.

වසර ගණනාවක් තිස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවලට භූමිය වූ මේ ගොඩනැගිල්ල තුළ, කිසිදු අමතර ඉදි කිරීම්වලින් තොරව අග්‍රාමාත්‍ය, කථානායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, විරුද්ධ පාර්ශ්වයේ නායක යන කාර්යාල සඳහාද, පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය හා

මන්ත්‍රීවරියන්ගේ ප්‍රයෝජනයට වෙන්වූ විශේෂ කාමරයක් සඳහා ද ඉඩකඩ සලසා දීමට හැකිවී ඇත.

මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ඉහළ යාම සහ ඊට සමානුපාතික ව පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු ප්‍රමාණය ද වැඩිවීම හේතු කොට ගෙන සහය පහසුකම් සහිත ප්‍රමාණවත් ඉඩකඩ ඇති නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ලක අවශ්‍යතාව පිළිබඳ අදහස් ඉස්මතු වීය.

1977 මහ මැතිවරණයෙන් පසු, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නව පාර්ලිමේන්තු මන්දිරයක් ඉදිකිරීමට නව රජය විසින් තීරණයක් ගන්නා ලදී. එය ඉදිකිරීම සඳහා 1979 ජූලි මස 04 වන දින පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දෙන ලදී.

### ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

III වන වික්‍රමබාහු රජුගේ ප්‍රබල මහාමාත්‍යවරයකුව සිටි කලින් නිශ්ශංක අලගකෝනාර නමින් හඳුන්වන ලද නිශ්ශංක අලකේශ්වර විසින් 14 වන සිය වසේ තෙවැනි කාර්තුවේදී ආරම්භ කරන ලද ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රාජධානිය, විශිෂ්ට නරපතියකු වූ VI වන පරාක්‍රමබාහු රජුගේ කීර්තිමත් පාලන සමයෙහි ශ්‍රී ලංකාවේ රාජ්‍ය කේන්ද්‍රස්ථානය බවට පත්ව තිබුණි. දැනට මහනුවර ශ්‍රී දළදා මාළිගාවෙහි තැන්පත් කර ඇති පූජනීය ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ එකල තැන්පත් කර තිබුණේද කෝට්ටේ රාජධානියෙහි ය.

"සැලළිහිණි" සංදේශය නම් සම්භාව්‍ය සංදේශ කාව්‍යයෙහි කතුවරයාණන් වූ මහා පඬි තොටගමුවේ ශ්‍රී රාහුල කිවි හිමියෝ මේ නුවර කීර්තිය සිය කවෙහි අතිවිශිෂ්ට ආකාරයෙන් වර්ණනා කරති. එදා VI වැනි පැරකුම්බා රජු දවස ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පුරවරයෙහි පැවති කීර්තිය සහ අසිරිමත්භාවය පාර්ලිමේන්තුවේ ප්‍රවේශද්වාරය දෙපස බිත්ති මත අද දින දැක ගැනීමට හැකි පරිදි පින්තාරු කර ඇත්තේ විශිෂ්ට චිත්‍ර ශිල්පී ආචාර්ය එල්. ටී. ජී. මංජුශ්‍රී මහතා විසිනි.

14 වන සියවසෙහි ශ්‍රී ලංකාවේ පැවති රාජධානි කිහිපය අතුරින් ප්‍රබලම රාජධානියෙහි අගනුවර වූයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරයයි.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරය 1982 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ පරිපාලන අගනුවර බවට පත් විණ. වාණිජ අගනගරය ලෙස කොළඹ හැඳින්වේ.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේහි පැවති පුරාණ ජල මාර්ගයක් වූ "දියවන්නා" ඔය මධ්‍යයේ පිහිටි කුඩා දූපතක ඉදිවුනු නව මන්දිරය වෙත කලින් අගනුවර වූ කොළඹ පිහිටුවා තිබූ පාර්ලිමේන්තුව රැගෙන එන ලදී. එකල ජනාධිපති ධුරය හෙබවූ අතිගරු ජූනියස් රිචර්ඩ් ජයවර්ධන මැතිතුමා විසින්, 1982 අප්‍රේල් මස 29 වැනි ගුරුදා පෙ.ව. 10.28ට යෙදුනු සුබ මොහොතින් අභිනව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. 1833 දී ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය පිහිටුවනු ලැබීමෙන් පසුව, ඒ සඳහා ඉදි වූ තුන්වන ගොඩනැගිල්ල මෙය වේ.

### ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි නව පාර්ලිමේන්තු සංකීර්ණය

#### වැඩ ආරම්භවේ

පිටකෝට්ටේ බැද්දගාන පාරෙන් ඔබ්බෙහි කොළඹ සිට සැතපුම් 10ක් පමණ නැගෙනහිරින් ඓතිහාසික දියවන්නා ඔය

මධ්‍යයේ පිහිටා ඇති අක්කර දහසයක ප්‍රමාණයකින් යුත් කුඩා දූපතක් පාර්ලිමේන්තු සංකීර්ණය ඉදි කිරීම සඳහා තෝරා ගන්නා ලදී.

එඩ්වඩ් රීඩ් සහ බෙග් සමාගමේ ජෙෆ්‍රි බාවා මහතා ගෘහ නිර්මාණ ශිල්පියා වශයෙන් පිළිගනු ලැබූ අතර, මිට්සුයි සමාගම් දෙකක ඒකාබද්ධ ජපන් සමාගමක් ශ්‍රී ලංකා රජය සමග පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වූ යෙන් බිලියන 6.3 (ඩොලර් මිලියන 25.4)ක කොන්ත්‍රාත්තුවට අත්සන් තැබී ය.

මෙම ගොඩනැගිල්ල තුළ ශ්‍රී ලාංකික කලා නිර්මාණ සහ ප්‍රතිමා මූර්තිමත් කිරීම සුප්‍රසිද්ධ ශ්‍රී ලාංකික කලාකරුවන් සහ මූර්ති ශිල්පීන් කීප දෙනෙකුට පවරන ලදී. ජපානය, පිලිපීනය, මැලේසියාව, සිංගප්පූරුව සහ ශ්‍රී ලංකාව යන රටවල ගෘහ නිර්මාණ ශිල්පීන්, ඉංජිනේරුවන්, කාර්මික ශිල්පීන්, පුහුණු හා නුපුහුණු කම්කරුවන් යන පිරිස් වලින් සමන්විත ජාත්‍යන්තර ශ්‍රම බලකායක් විසින් පාර්ලිමේන්තු සංකීර්ණයේ වැඩ ආරම්භ කරන ලදී. 1979 නොවැම්බර් මාසයේ සිට මාස විසි හයක කාල සීමාවක් තුළ දී නිම කිරීමට සැලසුම් කර තිබූ ඉදි කිරීම් වැඩ සටහන එම දිනට පෙර සම්පූර්ණ කරනු වස් මෙම සියලු ජාතීන්ට අයත් පිරිස් උරෙනුර ගැටෙමින් අවබෝධයෙන් සහ එකමුතුකම පිළිබඳ සාමූහික හැඟීමෙන් අති නවීන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ භාවිතා කරමින් මෙම කාර්යයෙහි නියැලුණහ.

වගුරු බිමක්ව පැවති පුරාණ දියවන්නා ඔය ආශ්‍රිත ප්‍රදේශය ගොඩ කර, දැනට පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට දිය අගලක ආරක්ෂාව සපයමින්, එය වටා අක්කර 300ක් පුරා විහිදෙන ජලාශය ඉදි කිරීමත්, මෙම දූපත වටා අඩි 3600ක් දිග, අඩි 6ක් උස, පාදමෙන් අඩි 6ක පළලැති මතුපිටදී අඩි 1 1/2ක් දක්වා ක්‍රමයෙන් සිහින් වන යෝධ ආරක්ෂක බැම්ම ඉදි කිරීම යන කරුණු දෙක මේ ශ්‍රම බලකාය මුහුණ දුන් ඉතාම ප්‍රබල අභියෝග දෙක විය. පහත් බිම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලයේ සේවකයෝ දැඩි ධෛර්යයකින් සහ කැපවීමෙන් යුතුව මේ කාර්යයන් සාර්ථකව නිම කළහ.



නව පාර්ලිමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල

මුල්ගල තැබීමෙන් මාස කීපයක් ඇතුළත ඓතිහාසික දියවන්නා ඔයෙහි මේ දැවැන්ත ගොඩනැගිල්ල ඉදි වෙමින් පැවතීම පිළිබඳව උද්‍යෝගිමත් ප්‍රසාදයක් පොදුවේ දක්නට ලැබුණි.

## සාම්ප්‍රදායික චාරිත්‍රය

පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතුවලින් තුනෙන් පංගුවක් නිම වීමෙන් ඉක්බිතිව, සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික චාරිත්‍රයක් වූ "නවරත්න නිදන් වස්තු තැන්පත් කිරීමේ උත්සවය" පවත්වන ලදී. යම් ඉදි කිරීමක් කරන විට එය කිසිදු අපල උපද්‍රවයකින් තොරව කලට වේලාවට නිම කිරීම සහතික කරනු වස් ඊට දේවාශිර්වාදය අපේක්ෂාවෙන් ඉදි විසින්, නිදන් වස්තු අඩංගු වූ ලියකමින්, මල්කමින් අලංකෘත වූ රිදී මංජුසාව එදින උදෑසන 10 පසුවී විනාඩි 40ට උදා වූ ශුභ මොහොතින් පාර්ලිමේන්තු සභාගැබේ ප්‍රධාන ද්වාරය පතුළේ තැන්පත් කරනු ලැබිණ.

උත්සවය පැවැත්වුණ ස්ථානය වූ අඩ වශයෙන් ඉදි කරන ලද ප්‍රවේශ ශාලාව විචිත්‍රවත් අන්දමින් සරසා තිබිණි. ජාතික ධජ, සැලළිහිණි සංදේශයේ නොයෙකුත් සිද්ධීන් නිරූපනය කැරෙන ධජ, මකර තොරණ ධජ හා විවිධ සත්ත්ව රූප සහ පාරම්පරික මෝස්තරවලින් නිර්මිත සාම්ප්‍රදායික ධජ පතාක එල්ලා විසිතුරු අන්දමින් සරසා තිබුණු සුවිසල් ප්‍රවේශ ශාලාවේ බිත්ති, ශ්‍රී ලංකා



මන්ත්‍රීවරුන්ගේ පිවිසුම් දොරටුව (පාර්ලිමේන්තු මන්දිරයේ ඇතුළත)

කිරීමේ අත්තිවාරම පතුළෙහි නවවිධ මාණික්‍ය ඇතුළු තවත් මංගල වස්තූන් නිදන් කිරීම සම්ප්‍රදායානුකූලව සිදු කිරීමේ සිරිත රකිමින් 1980 සැප්තැම්බර් මස 22 වැනි දින අළුයම් භාගයේ දී එය ඉටු කෙරිණි. ශ්‍රී ලංකාවේ ඉපැරණි සංස්කෘතික චාරිත්‍ර විධි වලින් අලංකෘත වූ චාම් උත්සවයක දී එවක අතිගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා ඉතිහාසයේ රජ දරුවන් පිළිගැනීම සඳහා යොදා ගනු ලබන විචිත්‍රවත් සැරසිලි රටාවක් වූ රැලි පාලම් අල්ලා අලංකෘත කර තිබිණි.

නිදන් වස්තු නිදන් ගත කිරීමේ උත්සවයට පෙරාතුව, නිදන් ගත සකල වස්තු සම්භාරයේ භාරකරු ලෙසින් සැලකෙන 'භෛරවයා' පිනවීම උදෙසා 1980 සැප්තැම්බර් මස 17 වැනි දින භෛරව පූජාවක් පවත්වනු ලැබිණ.

ඉන් අනතුරුව 1980 සැප්තැම්බර් මස 21 වැනි දින කෝට්ටේ ශ්‍රී රජමහා විහාරයේ දී සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනාවක් පැවැත්විණි.

මුල් ගල තැබීමෙන් මාස විසි හයක්ද, නිදන් වස්තු නිදන් කිරීමේ උත්සවයෙන් මාස දහ අටක්ද ඉකුත් වූ තැන, දියවන්නා ඔයේ සුනිල දිය දහර මැදින් ශ්‍රී ලංකාවේ සිව් මහල් පාර්ලිමේන්තු මන්දිරය රාජකීය ශෝභාවෙන් අනූනව ඉහළට නැගිණි.

දැකුම්කළු පරිසරයකින් වටව තුරු ලතාවෙන් සුසැදි සුන්දර භූමි දර්ශනය සිසාරා ගගන සිපින පාර්ලිමේන්තු මන්දිරයේ සෘජුරේඛීය ලෙසින් මනාව පහතට වැහෙන තඹ ආලේපිත මුදුන් වහලයේ කොත් කැරැල්ල, යට ගිය දවසෙක මෙනුවර පැවති ශ්‍රී විභූතිය වර්ණනා කරන සැලළිහිණි සංදේශයේ කවක් සිහියට නංවයි.

* තර සර හිමි මහල් මෙහි පහ පෙළැනිතොර
සුර සිඳු විදුදරන් සැදි සඳලු මනහර
කර වන මඟුල් කෙළියෙන් නොමැති අවසර
පුර සිරි බලන ලෙස බට සුර විමන් යුර
(*සැළලිහිණි සංදේශය - කුමාරතුංග විවරණය)

පාර්ලිමේන්තු ගොඩනැගිල්ල පිහිටා තිබෙන්නේ දූවක බැවින් අත්තිවාරම සම්බන්ධයෙන් විශේෂ පූර්වාරක්ෂණ පියවර ගනු ලැබීය. සමස්ත ගොඩනැගිල්ල දරා සිටිනුයේ වැර ගැන්වුණ කොන්ක්‍රීට් ජම්බාර කණු මගිනි. වහලයට යොදා ගැනුනේ ඉස්තරම් වර්ගයේ වානේ සහ තේක්කය. ඊට අමතරව ටොන් 100ක තඹ තහඩු වහලය සෙවිළි කිරීමට යොදා ගෙන තිබේ. ගොඩනැගිල්ල ඉදි කිරීමට යොදා ගත් ගොඩනැගිලි ද්‍රව්‍යවලින් සැලකිය යුතු ප්‍රමාණයක් ජපානයෙන් ආනයනය කරන ලදී. ලී බඩු සියල්ලම නිම වන ලද්දේ නම්දැරූ ශ්‍රී ලාංකික වඩු කාර්මිකයින්ගේ දෑතිනි.


පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, කාර්ය මණ්ඩලය සහ මහජනතාව සඳහා වෙන්වූ ප්‍රවේශද්වාර බිම් මහලේ පිහිටා ඇත. නැගෙනහිර දෙසින් පිහිටි මන්ත්‍රී ප්‍රවේශද්වාරය, මහින්ද අබේසේකර විසින් මැහෝගනී දැවයෙන් නිර්මිත වනදහනක දර්ශනයක් පිළිබිඹු කැරෙන අර්ධ උන්නත කැටයමකින් අලංකෘත කර තිබේ. ගොඩනැගිල්ලේ බටහිර දෙසින් පිහිටි කාර්ය මණ්ඩල ප්‍රවේශද්වාරය අනිල් ගාමිණී ජයසූරිය විසින් නිර්මාණය කරන ලද වගුරු බිමක අර්ධ උන්නත කැටයමකින් සැරසී ඇත. මෙම ප්‍රවේශද්වාර දෙකම එකම පිලකට යොමු වන අතර, එම කොරිඩෝව දෙපස බිත්ති සැරසී ඇත්තේ හිටපු සහ වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඡායාරූපවලිනි.

ප්‍රධාන ගොඩනැගිල්ලට ඇතුළු වීම සඳහා පරිගණකගත ප්‍රවේශ පාලන පද්ධතියක් ක්‍රියාත්මක වේ. ගොඩනැගිල්ල ඇතුළත ආරක්ෂාව මින් තහවුරු වන අතර, ඕනෑම අවස්ථාවක එහි සිටින අය ගැන විස්තර ක්ෂණයකින් දැන ගැනීමට ද හැකි වේ. ගොඩනැගිල්ලට පිවිසිය හැකි වන්නේ අවසර ලත් අයට පමණි. සභා ගර්භයට යන ප්‍රධාන පිවිසීම සඳහා උතුරු දෙසින් පිහිටි පුළුල් පියගැට පෙළ දෙපස දකින්නට ලැබෙන්නේ යන්ත්‍රානුසාරයෙන් රුරා හැලෙන දිය දහරක් දිය රැළි නංවමින් ගලා විත් වැටෙන අලංකෘත පොකුණු යුගලක් සහ රමණීය ලෙස සරසා තිබෙන පනා බැම්මකි. මේ පිවිසුම් මග ප්‍රවිශ්‍ය වන්නේ ගොඩනැගිල්ලේ ඉදිරිපස සක්මන් මගට ලම්බකව පිහිටි කුළුණු පේළියකින් සැදුම්ලත් දිගු වරණ්ඩයකටය. එය ඉදිරි ආලින්දයයි. එහි කෙළවර විවෘත ශාලාවකි. මෙම ශාලාව පාර්ලිමේන්තුවේ විශේෂ උත්සව අවස්ථා සඳහා මෙන්ම අභාවප්‍රාප්ත මැති ඇමතිවරුන්ට පාර්ලිමේන්තුවේ අවසන් ගෞරවය දැක්වීම සඳහා ද යොදා ගනු ලැබේ.

ඉදිරි ආලින්දයේ දෙකෙළවර, මිට්සුයි ඉදිකිරීම් සමාගමෙන් පාර්ලිමේන්තුවට පිරිනැමුණු විශාල අලංකාර සන්ධ්‍යා යුග්මයක් එල්ලා තිබේ. මනස්කාන්ත අල්ලි මෝස්තරයකින් හෙබි පිළේ සීලිම, ඊනා ද සිල්වා මහත්මිය විසින් විචිත්‍රවත් කැරුණකි. පිළේ මධ්‍යයේ පිහිටා තිබෙන්නේ රූටන ක්‍රමයට සැකසූ විශාල ලෝකඩ දොරකි. ඊට පිටුපසින් ඇත්තේ යකඩින් සහ රිදියෙන් නිමැවුණු ගේට්ටු යුගලකි. ඒ ගේට්ටු පසු කළ විට පිවිසෙනුයේ සෘජු කෝණාස්‍රාකාර හැඩැති ප්‍රවේශ ශාලාවකට ය. එතැන් සිට පියගැට පෙළ තුනක් ගිය තැන සභා ගර්භයේ ප්‍රධාන දොරටුව පිහිටා තිබේ.



මන්ත්‍රී පිවිසුමේ දාරුමය බිතු සිතුවම්



කාර්ය මණ්ඩල ප්‍රවේශයේ ඇති බිතු සිතුවමක්

### බිතු සිතුවම්

ප්‍රවේශ ශාලා බිත්ති සැරසී ඇත්තේ ආචාර්ය මංජු ශ්‍රී විසින් නිර්මාණය කැරුණු බිතු සිතුවම් වලිනි. මේ සිතුවම් අග්‍රගණ්‍ය කලා කෘතීන්ය. ඒ බිතු සිතුවම් කාගේත් නෙත් සිත් පැහැර ගනී.

ප්‍රධාන ද්වාරය අබියස වම් හා දකුණු පස බිත්ති අලංකෘත වී තිබෙන්නේ ශ්‍රී ලංකාවේ මුර දේවතාවුන් සිව් දෙනාගේ රූපවලිනි. දකුණුපස බිත්තිවල සිතුවම් වී ඇත්තේ සක්හඬ නංවන්නන් දෙදෙනෙකි. දෙව් රූ සහ සක් හඬවන්නන් දෙපසින් සශ්‍රීකත්වය විදහාපාන පාරම්පරික මෝස්තරයක් වන දෙළුම් ඵලයෙන් සහ පුෂ්පයෙන් සුසැදි රටාවකි.

### බිතු සිතුවම් - අතීතාවර්ජනයක්

පළමු වැනි හිණිපෙළ පා මුල සිට වම් පස බිත්තියේ පාර්ලිමේන්තු සභා ගර්භයට



ප්‍රධාන ගොඩනැගිල්ලේ ඉදිරි ආලින්දය හා කැටයම් කරන ලද සීනුව


එකිනෙක දේවරූපය වටකොට මකර තොරණ මුදුණේ, නාථ දෙවියන් සඳහා බෝ පත්‍රය ද, සමන් දෙවියන් සඳහා ශ්‍රී පාද ලාංඡනය ද, කතරගම දෙවියන් සඳහා සැවුලා ද, විභීෂණ දෙවියන් සඳහා 'කිබිහි' මුහුණ ද වශයෙන් ඒ ඒ දේවතාවාහට ආවේණික සංකේත රූප චිත්‍රණය වී තිබේ.

### හංසයින් සෞභාග්‍යයේ සංකේතයයි

පියගැට පෙළට පිවිසෙන ස්ථානයේ ප්‍රධාන ද්වාරයට මුහුණ ලා පිහිටි වම් හා පිවිසෙන රිදී දොරටුව දක්වා ද, එතැන් පටන් එහි දකුණුපස බිත්තියේ පළමු වැනි හිණිපෙළ පාමුල දක්වා ද, දිස් වන්නේ ප්‍රධාන බිතු සිතුවමය. පියගැට පේළි දෙපසින් පිහිටි මෙම බිත්ති සරසා ඇති සිතුවම් මාලාවෙන් පිළිබිඹු වනුයේ සැළලිහිණි සංදේශයේ අවස්ථාවන් ය.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රාජධානියකොට විසූ සවැනි පැරකුම්බා රජුගේ ඇවෑමෙන් සිහසුනට උරුම කී පුත් කුමරෙක් නොවී ය. එබැවින් රජුගේ දූ කුමරිය වූ උලකුඩයදේවී






සැළලිහිණි සන්දේශය - සභාගර්භයට පිවිසෙන ද්වාරය අසළ ඇති බිතු සිතුවම

හට පුත් රුවනක් ලබා දෙන මෙන් විභීෂණ දෙවියන්ට කන්නලව් කැරෙන සංදේශයක් කැලණියේ පිහිටි විභීෂණ දේවාලයට පිටත් කර යැවීමට තීරණය කරන ලදින් එහි දූත පක්ෂියා වශයෙන් "සැළලිහිණියා" තෝරා ගනු ලැබිණි.

සැළලිහිණි සංදේශයේ විස්තර කෙරෙන්නේ එකල ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අගනුවර සිට කැලණිය දක්වා වූ සැතපුම් හතක පමණ දුර සැළලිහිණියා ගිය මග වැණුමයි.

මන්දිරයට ඉහළින් දිස්වන පුන් සඳ සහ ගුරු තරුව ගමනාරම්භ කිරීමේ ශුභ මොහොත එළැඹ ඇති බැව් පෙන්වයි. සිතුවම පසු බිමෙන් දිස්වනුයේ ශ්‍රී ජයවර්ධනපුරය වටකොට ගලා බසින දියවන්නා ඔය ය. අනතුරුව දිස්වනුයේ ශ්‍රී දළදා මන්දිරයයි. විහාරයේ ඇතුළු ගෙයි හිඳ තේවාව කරන බෙරකරුවෝ ද, ඉහළ මාලයෙහි ශ්‍රී දන්ත ධාතූන් වහන්සේහට ගෞරව පෙරදැරිව තල් අත්තක් ඔසවා පුද සත්කාර කරන දියවඩන නිලමේ ද, දැසමන් මල් වට්ටියක් පූජා කරන ආවතේව භාර ස්වාමීන්වහන්සේ ද එහි වෙති.

බිතු සිතුවම් ඇඳීමේදී ආචාර්ය මංජු ශ්‍රී යොදාගෙන ඇත්තේ අඛණ්ඩ කථන ශෛලියයි. පියගැටපෙළ නැග ඉහළට නගින්නෙකුට වම් පස බිත්තියේ දිස්වන්නේ සැළලිහිණි වෘත්තාන්තය, නෙත් අබියස දිග හැරෙන ආකාරයයි.



සභාගර්භ ද්වාරය

යාබද බිත්තියේ දැක්වෙන චිත්‍රයෙන් පිළිබිඹු වන්නේ සේසත් සිංහ කොඩිය, ඉර හඳ කොඩිය හා අව් අතු යනාදි රාජකීය ලාංඡන අත දරා ගත් ස්වකීය පරිවාර සේනාව පිරිවරාගෙන සිටින සවැනි පැරකුම්බා නිරිඳුන් ය.

සභා ගර්භයට පිවිසෙන ද්වාරය අසල වම්පස චිත්‍රයෙන් පිළිබිඹු වනුයේ කෝට්ටේ මහසෙන් දෙව් විමන (කතරගම දේවාලය) සැවුල් ධජය, මයුර වාහනය සහ "නන්දි" ගවයා ය.

සංදේශ කාව්‍ය රචනා කළ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සිය දබරැඟිල්ල දිගු කර ගෙන (මූර්ති ශිල්පය අනුව මෙය පුද්ගලයෙකුගේ කථන විලාසය පෙන්වයි.) ස්වකීය සංදේශ කාව්‍ය අතැතිව සංදේශය රැගෙන යා යුතු මග හා එහි එන පණිවුඩය පිළිබඳව සැළලිහිණියාට උපදෙස් දෙන අයුරු එහි මනාව සිත්තම්කර තිබේ. ශ්‍රී දළදා

ආර්ය චක්‍රවර්ති රජු හා සටන් වැද ඔහු පරදවා යාපා පටුන ජයගෙන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත විජයග්‍රාහී විලාසයෙන් පෙරළා පැමිණෙන සපුමල් කුමරු, එනම්

පරාක්‍රමබාහු රජතුමාගේ සේනාධිනායක, සභා ගැබේ ප්‍රවේශ ද්වාරය අසල දකුණු බිත්තියේ සිතුවම් වී තිබේ.

"නිල තුරඟුට නැගෙමින් රිවි දෙව් සිරින
දුල කැරැ සේසත් මිණි බරණ කිරණින
බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන"

ඊළඟ චිත්‍රයෙන් දැක්වෙනුයේ කැලණි විහාරයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ, විහාර මන්දිරය සහ බැතිමතුන් පිරිසකි.

ගැයුමින් හා නර්තනයෙන් විභීෂණ දෙවියන් පුදන කිඳුරාංගනාවන් වැනි ස්ත්‍රීන්ගෙන් සුසැදි විභීෂණ දෙව්විමන හය වැනි මෙන්ම අවසාන බිත්තියේ දර්ශනය වේ. පෙන තුනේ නාග ශීර්ෂ කොඩිය, චූලෝදර මහෝදර සහ මණිඅක්ඛිත නාග රජවරුන්ගේ රාජධානිය වූ කැලණිය නියෝජනය කරයි. දෙව් විමනේ ඇතුළු එළිපත මත සිටින අයුරු සිතුවම් වී ඇත්තේ තමා රැගෙන ආ සංදේශය විභීෂණ දෙවියන්ට භාරදීමට සූදානම්ව බිමට බට සැළලිහිණියා ය.

"උලකුඩය දේවියට පුත් රුවනක් සොඳ
දුන මැනවි නිසි ලෙස"

## සභාගැබ ප්‍රවේශද්වාරය

පියගැටපෙළ මුදුනට ආවිට හමුවන්නේ සභාගැබට පිවිසෙන අලංකාරවූත්, මනා ලෙස සරසන ලද්දා වූත් ප්‍රධාන ද්වාරයයි. අඩි 12ක් දිගින් ද, අඩි 12ක් පළලින් ද, යුත් මේ දොර දැකුම්කළු ත්‍රිමාන හැඩයක් මවයි. එය තඹෙන් සාදා රිදී ආලේප කොට තනන ලද්දකි. එහි මතුපිට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ම කොටා තිබෙන්නේ පැරණි ශිලා ලේඛණ අක්ෂර කලාව අනුගමනය කරමිනි. පුරාණ ශ්‍රී ලංකාවේ කලා සම්ප්‍රදාය කුළුගැන්වෙන අයුරින් අලංකාර නෙළුම්මල් සහ නාරිලතාවන්ගෙන් සමන්විත මෝස්තර රටාවකින් මෙහි දාරය සැරසී තිබේ. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙහි දක්නට ඇති පුරාණ ශ්‍රී ලංකාවේ උඩු වියනක් සරසා ඇති පුෂ්ප මෝස්තරයකින් දොරේ පිටුපස කොටස අලංකාර කර තිබේ. මේ මාහැඟි කලා නිර්මාණය ලෝහ මූර්ති ශිල්පී ඩී. විමල් සුරේන්ද්‍රගේ දැතින් නිම විණි.

## සභා ගර්භය

සමස්ත ගොඩනැගිල්ලම ගත් විට එහි සැම දෙන මන බඳින ශෝභාසම්පන්න ප්‍රභාමත් ශාලාව සභා ගර්භයයි. හැඩයෙන් ඍජුකෝණාස්‍රාකාර වූ එය මහල් දෙකක් පුරා විහිදෙයි. කුඩාරමක හැඩයෙන් එල්බ ගත් එහි සීලිම සැරසී ඇත්තේ ප්‍රමාණයෙන් වර්ග අඩියක් වූ ඇනෝඩ පිරියම් කරන ලද ඇළුමිනියම් තහඩු 20,000 කිනි. මළ නොබැඳෙන වානෙන් තැනුණු අලංකාර යෂ්ටි මුදුනත සවි කරන ලද රජවරුන්ගේ ද, පන්සල්වල ද, කෝරලවල ද රිදීමය කොඩි දහඅටක් සහ අඩි හතක් උසැති ශ්‍රී ලංකා ජනරජ ලාංඡනය සභාගැබේ සවිකර ඇති අයුරින් ඊට අභිමානයක් ගෙන දේ. තඹ තහඩු කැබලිවලින් අලංකෘත සීලිමේ මධ්‍ය ලක්ෂ්‍යයෙන් එල්ලා වැටෙන රිදී ආලේපිත තඹයෙන් තැනුණු යෝධ පොකුරු පහන ශිල්පීය කුසලතාව මැනවින් පසක් කරමින් පෙරදිගට ආවේණික ශෝභාවක් ගෙන එයි. මේ අතිශය දීප්තිමත් මනරම් මෝස්තරය ලකී සේනානායකගේ නිමැවුමකි. මැලේසියාවෙන් ආනයනික තද දුඹුරු සියඹලා දැවයෙන් ආස්තරණය වූ පනේල චිත්තාකර්ෂණීය බවත් ගෙන එයි. ලෝහිත වර්ණ ඉන්දීය විල්ලුද පලස බිම අතුරා ඇති හැටියෙන් මහත් තේජාන්විත බවක් මෙන්ම අලංකාර බවක් ඊට එක්වේ. පාර්ලිමේන්තුවේ කටයුතු මෙලෙසින් අද ඇරඹෙනුයේ කලා නිර්මාණ රසක ආශ්වාදය ලබමිනි.

සභා ගැබේ දකුණු කෙළවර මධ්‍යයේ කථානායකතුමාගේ අසුන පනවා තිබේ.

නව පාර්ලිමේන්තු සංකීර්ණය - විවිධ කෝණවලින් පෙනෙන සැටි












අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පාර්ලිමේන්තුව ඇමතීම

ඊට පහතින් ඇත්තේ පාර්ලිමේන්තුවේ මහලේකම්, නියෝජ්‍ය මහ ලේකම් සහ සහකාර මහලේකම්වරුන්ගේ අසුන් ය. මන්ත්‍රීවරුන්ට ආසන සකස් වී ඇත්තේ මේස සහ කළු පැහැ පදම් කළ සමින් නිම වූ ආසන පේළි පුළුල් සභා ගර්භය තුළ මාලකාකාරයෙන් පිහිටන පරිද්දෙනි. ආසන දහසය බැගින් ඇති දෙපාර්ශ්වයේ අවසන් පේළි දෙක හැරුණු විට එක් එක් පේළියේ ආසන විස්ස බැගින් ඇත. එය සකස් වී ඇත්තේ එක් කට්ටලයකට ආසන හතර බැගින් වූ කට්ටල පහ බැගිනි. කථානායකතුමාගේ දකුණුපසින් ඇති අසුන් ආණ්ඩු පක්ෂයට වෙන්කර තිබේ. සභා ගර්භයේ සීමා සලකුණේ සිට මේ පාර්ශ්වයේ පළමු පෙළේ සිව්වැනි ආසන කට්ටලයේ පළමුවැනි ආසනය ජනාධිපති අසුනයි. ඊළඟ අසුන අගමැති අසුනයි. ජනාධිපති අසුනට මුහුණ ලා අනෙක් පාර්ශ්වයේ අසුන් ගන්නේ විපක්ෂ නායකවරයාය. අග්‍රාමාත්‍යතුමාගේ දකුණුපසින් ඇති ඊළඟ අසුනේ සිටින්නේ සභානායකවරයා ය.



ආලින්දයේ සිට සභා ගර්භයට පිවිසෙන දොරටුවේ ඇති ඔර්ලෝසුව

පාර්ලිමේන්තුවේ අසුන් පනවනු ලබන්නේ ජ්‍යෙෂ්ඨත්ව පදනමින් වන අතර, හැම මන්ත්‍රීවරයකුහටම අසුන් වෙන් කෙරෙනුයේ කථානායකතුමා විසිනි. කථානායක අසුන දෙපස එක් පාර්ශ්වයක ආසන 116 බැගින් මන්ත්‍රීවරුන් 232නෙක් හට අසුන්ගත හැකි අයුරින් ඉඩ සලසා ඇත.



**සභාගර්භය අලංකාරවත් කරන පොකුරු පහන**

**සභා ගර්භයේ සීමා සලකුණ**

ප්‍රධාන ප්‍රවේශද්වාරයේ සිට සභා ගර්භයට විහිදෙන පියගැට පෙළට මඳක් ඔබ්බෙන් දක්නට ලැබෙන්නේ ලෝහිත පැහැති විල්ලුද පලස මත තබන ලද නිකල් ලෝහයෙන් නිර්මිත ඍජුකෝනාකාර හැඩැති තහඩුවකි. මෙය සභා ගර්භයේ සීමාව සලකුණු කරයි.

මෙම ලෝහ පටියේ මුහුණත ප්‍රෞඪත්වය, චිරස්ථායිත්වය සහ සෞභාග්‍ය සම්පන්න බවේ සම්ප්‍රදායික සංකේතයන්ගෙන් සියුම්ව කැටයම් කර තිබේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැරුණ විට අන් කිසිවෙකු හට හෝ මේ සභා සීමාවෙන් ඔබ්බට පිය නැගිය නොහැකිය. මහ මැතිවරණයකට පසු පාර්ලිමේන්තුව රැස් වූ ඇසිල්ලෙහි මන්ත්‍රීවරයෙකු ලෙසින් දිවුරුම් දීමට සූදානම්ව සිටින තැනැත්තකු හෝ තැනැත්තියක හෝ පාර්ලිමේන්තුව විසින් කැඳවන ලද වෙනත් පුද්ගලයකු හෝ හැර අන් සියල්ලෝම සභා සීමාව අසළ රැඳී සිටිය යුත්තාහ. සභා සීමාවෙන් ඔබ්බෙහි එහි දෙපස අසුන් ගෙන සිටිනුයේ වේත්‍රධාරී සහ නියෝජ්‍ය වේත්‍රධාරීය.

සභා ගැබේ ඉහළ කොටස වෙන්වන්නේ පුද්ගලයින් 600 දෙනෙකු හට අසුන් පනවා ඇති මහජන ගැලරිය සඳහා ය. මෙහි එපමණම පුද්ගලයින් සංඛ්‍යාවකට සිටගෙන සිටීමේ පහසුව ද සළසා තිබේ. කථානායකතුමාගේ අස්න කෙළින් අනෙක් පාර්ශ්වයේ කථානායකතුමාගේ විශේෂ සම්භාවනීය අමුත්තන් හට වෙන් වූ ගැලරිය පිහිටා තිබේ.

කථානායකතුමාගේ අසුනට ඉහළින් පිහිටි ගැලරියේ මාධ්‍යවේදීන්ට අසුන් පනවා තිබේ.

සභාව තුළ ශ්‍රවණ තත්ත්වය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු වී ඇති අතර, ශබ්දය ප්‍රතිරාවය වීම අවම මට්ටමට අඩු කරනු ලැබ තිබේ. සභා ගැබේ සිට මෙන්ම ගැලරියේ සිට කථාවලට සවන්දිය හැකි වන පරිද්දෙන් ශබ්දය විහිදුවාලීම උදෙසා මයික්‍රොපෝන සවිකර ඇත. දෙවැනි මහලේ පිහිටි වීදුරු මුහුණතකින් ආවරණය වූ ශබ්දය එළියට නොඑන සේ සකස් කරන ලද කථා පරිවර්තකයින්ගේ කුටිවලට සියලු මයික්‍රොෆෝන් සම්බන්ධ කර ඇත.

සභා ගැබේ පැවැත්වෙන කථා වටහා ගැනීමට අසීරු මන්ත්‍රීවරුන්ගේ පහසුව තකා තමා කැමති භාෂාවෙන් සවන් දීමේ පහසුකම් තෝරා ගැනීම සඳහා වූ උපකරණ

සීලිං ලාම්පු වලින්ද, උඩු මහලේ නොපෙනෙන සේ අසුරා ඇති ආලෝකධාරාවලින් සහ යෝධ පොකුරු පහනින් ද සභා ගැබ අලෝකවත් වේ.



**සභා ගර්භයේ සීමාව**

මන්ත්‍රීවරුන්ගේ මේසයට සවි කරනු ලැබ ඇත. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම කථා පරිවර්තන පහසුකම් සළසා ඇති අතර, ශ්‍රවණාධාරයක් මඟින් ඊට සවන් දිය හැකි ය.

සභාගර්භයට පසුව එක්කළ අංගයකි වීඩියෝ කැමරා සංවෘත පරිපථ පද්ධතිය. මේ කැමරා සවිකර ඇත්තේ සභා ගැබේ පසු පෙළට පිටුපසිනි.

සභාගැබ දෙපස පිහිටි පුළුල් ආලින්දයක් ඔස්සේ මන්ත්‍රීවරුන්ට ඊට එළඹිය හැකි ය. මේ ආලින්දයන්හි බිම සකසා තිබෙන්නේ කඩුවෙල ප්‍රදේශයේ ගල්වලවල් වලින් ලබාගත් ලා රෝස පැහැති මදින ලද කළුගල් වලිනි. ආලින්දය මට්ටමේම පිහිටි අගු ආවරණයකින් යුතු තණ බිමෙහි සිටුවා ඇති අරලිය ගස් පෙළින් මනස්කාන්ත දසුනක් ද ඒවායේ මල් වලින් මිහිරි සුවඳක් ද ඇති වේ.




**සභාගැබ දෙපස පිහිටි මන්ත්‍රී ආලින්දය**

සමගාමීව ක්‍රියා කරන බිත්ති ඔරලෝසු දෙකක් පැහැදිලිව පෙනෙන ස්ථානයක රඳවා තිබේ. ගොඩනැගිල්ලේ විවිධ ස්ථානවල රඳවා තිබෙන ගණපූරණ සීනුවලින් විහිදෙන්නේ සැලළිහිණියාගේ මියුරු නාදයයි. ඒ නාදය බිහි කරන ස්විචයන් කථානායක නිලකාමරයේ මේසයේත් සභාගැබේ මහ ලේකම් මේසයේත් සවිකර ඇත.

### ග්‍රහතාරකාවක් ලෙසින්

පාර්ලිමේන්තු ගොඩනැගිල්ල වර්ග මීටර 48,000ක භූමියක් වසා පැතිරෙයි. ඒ වටා පිහිටි කුඩා ගොඩනැගිලි මගින් එයට උපග්‍රහයින්




**කථානායක ගැලරියට පිවිසෙන ද්වාරය අසළ ඇති සිතුවමක්**

පිරිවරා ගත් ග්‍රහලෝකයක සිරිය එක් කෙරේ. ඒ සා විශාල ගොඩනැගිල්ලක් වර්ණනා කිරීම හුදු තොරතුරුවලට පමණක් සීමා කිරීම නිසරු කර්තව්‍යයක් වනු ඇත. එසේ වුවද එහි අගය දැනෙනුයේ මෙහි කාර්යයෙහි නිරත සැමෙකකුගේ උපරිම සුව පහසුව සැලසෙන අයුරින් එය නිමවා ඇති බව අවබෝධ වන පරිදි මෙහි සෑම කොටසක ම සැරි සැරීමට අවසර නොලබන ආගන්තුකයාට ය.

ප්‍රධාන ගොඩනැගිල්ල වායු සමනය කොට ඇත. ජනාධිපති, අගමැති, කථානායක, ඇමතිවරු, විපක්ෂ නායක, නියෝජ්‍ය කථානායක සහ නියෝජ්‍ය කාරක සභා සභාපති යන සියල්ලන්ටම නවීන පහසුකම්වලින් යුතු ගෘහ භාණ්ඩාදිය සහිත කාමර සපයා දී ඇත.


සෝපාන පංක්ති සහ කැටපත් තහඩුවෙන් හෙබි බිත්ති සහිත විදුලි සෝපාන මගින් සෑම මහලක්ම යා කෙරේ.

මෙහි ඇති අනෙකුත් වැදගත් පහසුකම් වන්නේ විශාල පුස්තකාලය, රැස්වීම් කාමර,

### භූමි භාගය

ප්‍රධාන භූමියට දූපත යා කරන "මගුල් මහවත" නමින් හැඳින්වෙන රන්වන් මලින් බරවූ ඇහැල ගසින් හා රත් පැහැ දළුලන නා ගසින් දෙපසසැදි උස් වූ මගෙකි. දූපතට ඇති ප්‍රධාන ප්‍රවිෂ්ඨ මාර්ගය මෙය වෙයි. මෙම මග දිගේ ඇවිද යන්නකුට ජලාශයේ පවන් රැළි වැදී චංචල වෙමින් තුරු අතරින් නිති නිරාවරණය වන කදිම දසුනක් රස විඳිනු හැකි ය. ගොඩනැගිල්ල පශ්චිම දෙසින් ද ආරක්ෂිත පාලමකින් සැදි තවත් පිවිසුම් මගෙකි.

මගුල් මහවත කෙළවරෙහි පිහිටි පොලිස් මුරපලෙකි. පොලිස් මුරගෙය පසෙකින් වන්නේ පාර්ලිමේන්තුවේ විවෘත කිරීමේ උත්සවය සහ ආචාර පෙළපාලි නැරඹීම සඳහා භාවිතා වන විශාල චතුරස්‍රයයි. පොලිස් මුරගෙයට එපිටින් ඇති ඉදිරි භූමි භාගයෙහි විසල් වූ අලංකාරවත් පොකුණක් ඇත.




සභා ගර්භයේ දළ සටහන

1. කථානායකතුමා
2. ජනාධිපතිතුමා

2A. අගමැතිතුමා

3. විපක්ෂ නායකතුමා
4. පාර්ලිමේන්තුවේ මහලේකම්
5. පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම්
6. පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම්
7. පාර්ලිමේන්තු සභා මේසය
8. සෙංකෝලය
9. ආණ්ඩු පක්ෂයේ ආසන
10. විපක්ෂයේ ආසන
11. සභා ගර්භයේ සීමාව
12. වේත්‍රධාරී
13. නියෝජ්‍ය වේත්‍රධාරී
14. හැන්සාඩ් නිලධාරීන්
15. පාර්ලිමේන්තු පරිපාලන නිලධාරීන්
16. පුවත්පත් ගැලරිය
17. ගැලරිය 1 (මහජනයා සඳහා)
18. ගැලරිය 2 (මහජනයා සඳහා)
19. ගැලරිය 3 (මහජනයා සඳහා)
20. කථානායක ගැලරිය


## සභා ගර්භය තුළ පිහිටි ධජ හා පතාක - සැලැස්ම

*කථානායක ආසනය*

| සලාගම බ්‍රාහ්මණ කොඩිය, අහුංගල්ල | දවුණ්ඩ කොඩිය |
|---|---|
| 1. හතර කෝරළේ දිසා කොඩිය, කෑගල්ල | 1. මොණර කොඩිය |
| 2. සිංහ කොඩිය | 2. සිංහ කොඩිය, වත්තේගෙදර පන්සල නාදුගල, මාතර |
| 3. තුන් කෝරළේ දිසා කොඩිය, කෑගල්ල | 3. දුටුගැමුණු රජුගේ ධජය |
| 4. හතර කෝරළේ දිසා කොඩිය, මහනුවර | 4. කොටියා කොඩිය, වෙල්ලස්සේ මුහන්දිරම්ගේ දිසාකොඩිය, මහනුවර |
| 5. රුහුණු කතරගම දේවාලේ කොඩිය, මහනුවර | 5. සුදලිය මරුවලිය කොඩිය, මහනුවර |
| 6. ඌව දිසා කොඩිය, කුණ්ඩසාලේ, මහනුවර | 6. මහසෙන් සැවුල් කොඩිය, මහනුවර |
| 7. එළාල කොඩිය, දඹුල්ල ලෙන් විහාර බිතු සිතුවම්,රත්නපුර | 7. සිංහල රාජකීය කොඩිය |

හත් කෝරළේ දිසා කොඩිය, කෑගල්ල කතරගම දේවාලේ කොඩිය, මහනුවර

*ප්‍රධාන ද්වාරය*



අමුත්තන් පිළිගැනීමට වෙන් කළ ප්‍රදේශ, භෝජන කාමර, මුළුතැන්ගෙය, වෛද්‍ය මධ්‍යස්ථානය, ආයුර්වේද ඔසු හල, බැංකුව සහ ලෝකයේ ඕනෑම ස්ථානයකට ක්ෂණිකව පණිවුඩ සම්ප්‍රේෂණය කළ හැකි අති නවීන ටෙලෙක්ස් හා විද්‍යුත් තැපැල් පහසුකම් සහිත තැපැල් කාර්යාලයයි.

පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලයට අතිරේකව සභානායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, විපක්ෂ නායක සහ පාර්ලිමේන්තුව තුළ නියෝජනය වන්නාවූ පක්ෂවල නායකයින්ගේ කාර්යාල ද පාර්ලිමේන්තු සංකීර්ණය තුළ පිහිටා ඇත.

දුරකථනය හා රූපවාහිනී යන්ත්‍රයක් ද සහිත කාමරයක් මාධ්‍යවේදීන්ගේ පරිහරණය සඳහා වෙන් වී ඇත.

මෙකී සියලු අංගයන්ගෙන් යුත් ගොඩනැගිලි සංකීර්ණය අංග සම්පූර්ණ කරනු පිණිස, මෝටර් රථ 200කට වඩා ගාල් කළ හැකි ආවරණිත විශාල රිය ගාලක් ද, තුරු සෙවණ යට හිඳ දියවන්නා විලෙහි රළ නගන ජලතලය දෙස නෙත් යොමාගෙන ගිමන් හැරීමට හැකි ලෙස තනා ඇති තණ බිම් ද එයට එක් වී ඇත.

මහා බ්‍රිතාන්‍යයෙහි මහජන මන්ත්‍රී මණ්ඩලයෙහි සම්ප්‍රදාය මගින් සම්භාවනාවට පාත්‍රවූ බ්‍රිතාන්‍ය සිරිතට අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේද ආරක්ෂාව පිළිබඳ මෙහෙවර පැවරී ඇත්තේ පාර්ලිමේන්තුවේ වේත්‍රධාරී වෙතය. එහෙත් පාර්ලිමේන්තුවේ ආරක්ෂාව නිගමනය කරනු ලබන්නේ සභාපතිවරයා වශයෙන් කථානායකතුමාගෙන් ද, පාර්ලිමේන්තුවේ, සන්නද්ධ හමුදාවල සහ පොලීසියේ උසස් නිලධාරීන්ගෙන් ද සමන්විත ආරක්ෂක කමිටුවෙනි. වේත්‍රධාරිවරයාගේ උපදෙස් පරිදි පාර්ලිමේන්තු පොලීසිය ක්‍රියා කරන අතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකුගේ ප්‍රධානත්වය ඇතිව 280 දෙනෙකුගෙන් පමණ සමන්විත පොලිස් කොට්ඨාසයක් පාර්ලිමේන්තුව සතු ය.

**සෙංකෝලය - වේත්‍රය**

පාර්ලිමේන්තුවේ අණසක සංකේතවත් කරන සෙංකෝලය වර්ෂ 1949 දී බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් ලංකාවට පරිත්‍යාග කරන ලදී. එකල එහි වටිනාකම පවුම් 2500ක් විය. එහි බර රාත්තල් 28ක් (කිලෝ ග්‍රෑම් 12.7ක්) වන අතර, දිග අඟල් 48 (මීටර් 1.22)කි. එහි ආකෘතියට ආභාෂය ලැබී ඇත්තේ ලංකාවේ ඉපැරණි සිද්ධස්ථානවල ගෘහ නිර්මාණ ශිල්පයෙනි. එහි අලංකරණය නිම වී ඇත්තේ නෙළුම් මල පදනම් කොට ගෙන ය. පිපුණු නෙළුම් මල සදාතනිකත්වයේ හා අලංකාරයේ සංකේතයක් වන අතර, වැසුණු නෙළුම පරිපූර්ණ සාමය විදහා දක්වයි. රිදියෙන්, කැරට් 18 රනින් හා නීල මාණික්‍යයෙන් සැරසී ඇති කළුවර



සෙංකෝලය

ලී යෂ්ඨියකින් සෙංකෝලය සෑදී ඇත. එහි පහත කොටස රනින් හා රිදියෙන් කළ යටිකුරු නෙළුමකින් සෑදී ඇති අතර, පළමු කුඩුම්බිය ද නෙළුම් මලකින් හා කැටයම් නෙළන ලද රන් වළලු 2කින් සමන්විත වේ. එයට ඉහළින් වඩා පුළුල්, රටා නෙළන ලද රන් වළල්ලක් සහිත නීල මාණික්‍යමය පටියක් ද ඊට ඉහළින් අටපට්ටම් රිදී කුඩුම්බියක් ද ඇත. එම කුඩුම්බිය මතින් ඇත්තේ පෘථිවියේ දිශා 4 සංකේතවත් කරන නෙළුම් මලේ ස්වරූපයම ගන්නා රිදීයෙන් හා කැරට් 18 රනින් කළ පෘෂ්ඨ 4කි. එහි සිට නිල්මිණි හා රන් බිඳු කඩා හැලෙනයුරු අනුකරණය කර ඇත. මීට ඉහළින් සනකයක් ඇති අතර, එහි පැතිවල සංකේත හතරක් කොටා ඇත. ඒවා නම්, සදාතනික බව සංකේතවත් කරමින් හිරු හා සඳු, ඉදිරි ගමන සංකේතවත් කරන චක්‍රය සහ සෞභාග්‍යය සලකුණු කරන මල් බඳුන (පූර්ණ ඝට)ය. සෙංකෝලයේ ප්‍රධානතම අංගය ඇත්තේ ඊට ඉහළින්ය. මෙය රිදී ගෝලයක් වන අතර, ඒ මත අසිපත් අමෝරා සිටින සිංහයින් දෙදෙනෙකු (සිහළ) කොටා ඇත. නැවතත් මෙම ගෝලයට ඉහළින් නීල මාණික්‍ය වළල්ලක් ද ඔප දමන ලද පවිත්‍රත්වයේ සංකේතයක් වන අටපට්ටම් පළිඟුමය අග්‍රයක් ද දක්නට ලැබේ.

සෙංකෝලය පාර්ලිමේන්තුවේ අණසකෙහි ද පාර්ලිමේන්තුව මගින් එහි කථානායකවරයාගේ අණසකෙහි ද සංකේතයක්ව මෙතෙක් පැවතී ඇති හෙයින්, සෙංකෝලය නොමැතිව පාර්ලිමේන්තුවට මන්ත්‍රණයෙහි යෙදිය නොහැක්කේ ය. සෙංකෝලය රැගත් වේත්‍රධාරී පෙරටු කොට ගෙන මහලේකම් හා ඔහුගේ අනුප්‍රධානීන් ද පිරිවරා ගෙන කථානායකතුමා පාර්ලිමේන්තු සභා ගර්භයට ඇතුළුවීම හෝ පිටවීම සිදු වේ. පාර්ලිමේන්තුව රැස් වන විට වේත්‍රධාරී විසින් මහ ලේකම්තුමාගේ මේසයට පහළින් සෙංකෝලය තැන්පත් කරනු ලැබීම සඳහාම තනවා ඇති ආධාරකය මත එය තැන්පත් කරනු ලැබේ.

### කථානායකතුමාගේ ආසනය

බ්‍රිතාන්‍යයේ මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් ලංකාවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පරිත්‍යාග කරන ලද කථානායක ආසනය, වසර 200කට වඩා පැරණි බවට වාර්තාගත වී ඇති පිරිසිදු "ඕක්" ලීයෙන් නිර්මාණය කරන ලද්දකි. දෙවන ලෝක යුද සමයේ දී අඩ වශයෙන් විනාශ වුණු මහජන මන්ත්‍රී මණ්ඩලයේ මුදුන් ලීයේ කොටසකින් මේ ආසනය තනවා ඇත. එය අඩි 6ක් (ආසන්න වශයෙන් මීටර් 1.83ක්) පමණ උස වන අතර, පතුවල හැඩයට කැටයම් නෙළා රන් ආලේප කොට ඇත. එය අඳුරු ලෝහිත වර්ණ සම්වලින් ආස්තරණය වී තිබේ. ආසනයේ මස්තකයට පහළින් සමින් වැසුණු කොටස මත අසිපත් අමෝරා සිටින සිහළ සිංහයින් (සීහල) මතුපිටට නෙරන සේ නෙළා ඇත.

### උත්සව

පාර්ලිමේන්තුව හා සම්බන්ධ බොහෝ උත්සව, බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ඒවායින්



කථානායක ආසනය

ආහාසය ලබා සකස් කර ගන්නා ලද ඒවායි. මේවා පාර්ලිමේන්තුවට සම්බන්ධ විචිත්‍ර උත්කර්ෂවත් අවස්ථා වේ. මේ අතරින් වඩාත්ම උත්කර්ෂවත් උත්සවය පාර්ලිමේන්තු සැසිය විවෘත කිරීම වන අතර, එහිදී උත්සවකාරී විභූතියකින් යුතුව පෙරහැරකින් සම්ප්‍රාප්ත වන ජනාධිපති, මඟුල් බෙර වාදනයක් හා ජයමංගල ගාථා සජ්ඣායනක් ද සහිතව, චාරිත්‍රානුකූල ඇඳුමින් සැරසුණු කථානායකවරයා හා පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් පිළිගනු ලබයි. මෙම විශේෂ දිනයේ දී සම්භාවනීය පුරවැසියෝ හා නිලධාරීහු කථානායතුමාගේ විශේෂ ආරාධනය ලබා පැමිණෙති. ඉන් අනතුරුව ඔවුහු, එළැඹෙන කාලවකවානුව තුළ රජයේ වැඩසටහන් පිළිබඳව පුළුල් විවරණයක් කැරෙන "රාජාසන කථාව" ට සවන් දෙති.

තවත් උත්කර්ෂවත් අවස්ථාවක් වන්නේ මුදල් අමාත්‍යවරයා ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා වන සිය අයවැය සැලසුම් විවරණය කරන අයවැය කථාවයි.

## පාර්ලිමේන්තු රැස්වීම්

ස්ථාවර නියෝග අනුව, පාර්ලිමේන්තුව, එක් එක් මාසයේ ප්‍රථම ඉරිදා සහ තුන්වන ඉරිදා දිනවලට පසුව එළැඹෙන සති දෙකෙහි අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා හා සිකුරාදා දිනවල රැස්වේ.

පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ 2 වන මහලේ සිට මඟුල් මහවතට මුහුණ ලා සිංහ ධජය පූර්ණ කුඹුකොට ඔසවනු ලබන්නේ "පාර්ලිමේන්තුව රැස්ව සිටී"ය යන්න ප්‍රකාශ කිරීමට ය. රැස්වීම පස්වරු 06.30 ට පසුවද (මෙම වේලාව සම්මත ඉර බසින වේලාව යැයි සැලකෙන හෙයින් ඉන්පසුව ජාතික කොඩිය ඔසවා තැබීමට අවසර නොලැබේ.) දිගටම පැවැත්වෙන්නේ නම් පාර්ලිමේන්තුව තවමත් මන්ත්‍රණයේ යෙදී සිටින බව සංකේතවත් කිරීම පිණිස ධජ කණුව මත ජාතික කොඩිය වෙනුවට දුඹුරුවන් කහ පැහැති පහනක් දන්වනු ලැබේ.

## පාර්ලිමේන්තුවේ කටයුතු

පාර්ලිමේන්තුවේ කටයුතු එහි ස්ථාවර නියෝග අංක 19 ප්‍රකාරව පහත දැක්වෙන අනුපිළිවෙළට සිදු කරනු ලැබේ:-

(1) නව මන්ත්‍රීවරයකුගේ නිල ප්‍රතිඥාව හෝ දිවුරුම් දීම.
(මෙය පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් සිදු කරනු ලැබේ.)

(2) ජනාධිපතිතුමාගෙන් ලත් සංදේශ

(3) කථානායකතුමාගේ නිවේදන

(4) ලිපි ලේඛන පිළිගැන්වීම
(මෙය කථානයකතුමා, ඇමතිවරයකු හෝ නියෝජ්‍ය ඇමතිවරයකු විසින් පමණක් කරනු ලැබිය හැකිය.)

(5) කාරක සභාවල වාර්තා පිළිගැන්වීම

(6) පෙත්සම්

(7) ප්‍රශ්න

(8) ශෝක ප්‍රකාශ යෝජනා

(9) නොපැමිණ සිටීමට අවසර දීමේ යෝජනා

(10) අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

(11) පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම්

(12) වරප්‍රසාද ප්‍රශ්න
(පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳව හදිසි යෝජනාවක් අන් කවර හෝ යෝජනාවක් හෝ දිනට නියමිත කටයුත්තක් අභිභවා ප්‍රමුඛත්වය ගන්නා අතර මේ කර්තව්‍යය සඳහා ඕනෑම වේලාවක අනෙකුත් කටයුතු අත්හිටවනු ලැබිය හැකිය.)

(13) කලින් දැනුම්දීම අවශ්‍ය නොවන, ප්‍රධාන කටයුතු ආරම්භයේ දී ඉදිරිපත් කරනු ලබන යෝජනා

(14) කලින් දැනුම්දීම අවශ්‍ය වන, ප්‍රධාන කටයුතු ආරම්භයේ දී ඉදිරිපත් කැරෙන යෝජනා

(15) ප්‍රධාන කටයුතු
(ඒ ඒ දිනයට නියමිත කටයුතු හා යෝජනා.)

## ගරු කථානායකතුමා

කථානායක තනතුරේ සුවිශේෂ ලක්ෂණය වන්නේ එහි ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වයයි. කථානායක ධුරයේ මේ ගුණාංග ඇතිකර ගැනීමට උපකාරි වීම සඳහාත්, සභාවේ විශ්වාසය දිනාගත හැකි වනු සඳහාත්, එසේම ඔහුගේ නියෝගවලට අවනතභාවය ඇති කරනු සඳහාත් බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලයේ කථානායකවරයා පත් කරනු ලැබූ පසු සිය පක්ෂයට තිබූ පක්ෂපාතීත්වය අත්හැර දැමීමේත්, ආසනයේදීත් ඉන් පිටතදීත් සිය පක්ෂය සමග ඇති සියළු සම්බන්ධකම් නවතා දැමීමේත් සම්ප්‍රදාය අනුගමනය කැරිණ. ශ්‍රී ලංකාවේ ද මේ සම්ප්‍රදාය අනුගමනය කරනු ලැබේ.

කථානායක තනතුර සම්භාවනීය මෙන්ම ඉතා වැදගත් ද වේ. කථානායකවරයා ජනාධිපතිවරයාට හා ඔහුට පහළින් ඊළගට සිටින වැදගත් පුද්ගලයා වන අගමැතිවරයාට පමණක් තනතුරින් පහළින් තුන්වැනි ස්ථානයේ සිටී.

කථානායකවරයාගේ බලය ඔහුට ලැබී ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත සහ පාර්ලිමේන්තු සම්ප්‍රදායන් හා පරිචය යන මේවා මගිනි. ඔහු පාර්ලිමේන්තු රැස්වීම්වලදී මුලසුන දරන අතර, විනය රීති පිළිපැදිනු ලැබීම පිළිබඳ වගකීම ද උසුලයි. පනත් කෙටුම්පත්වල හෝ ප්‍රජා අශක්නුතාවට භාජන කිරීම හා මන්ත්‍රීවරයකු නෙරපා හැරීම පිළිබඳ යෝජනා සම්මතයක සහතිකය සටහන් කිරීම, ජනාධිපති එම නිලයෙන් පහ කිරීම පිළිබඳ යෝජනා සම්මතයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීම සහ යම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්ති හා නොගැටෙන බවට වගබලා ගැනීම මෙම නිලයේ ස්ථාපිත රාජකාරිවලින් සමහරකි. කථානායකවරයා පාර්ලිමේන්තුව සම්බන්ධ යහපත් සියළු දැයෙහි සංකේතයයි. ඔහු පාර්ලිමේන්තුවේ ප්‍රධානියා වශයෙන් ඔහුට පිරිනැමෙන ගෞරවය පිළිගන්නේ එහි අණ දෙන්නෙකුට වඩා තමා එහි මාර්ගෝපදේශකයාය යන හැඟීමෙන් යුක්තව ය. පාර්ලිමේන්තුව විසින් ඔහු වෙත පවරා ඇති අධිකාරිය ඔහු ක්‍රියාත්මක කරනුයේ නීත්‍යානුකූල ලෙසත්, පාර්ලිමේන්තුවේ යහපත පිණිසත්ය.

ඔහු පාර්ලිමේන්තුවේ බලතල, රැස්වීම් හා ක්‍රියාමාර්ග සහ ගෞරවනීයත්වය සම්බන්ධයෙන් එහි නියෝජිතයා ද වන්නේය. ඔහු කාරක සභාවලට සභාපතිවරුන් හා සාමාජිකයින් පත් කරන අතරම, පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාව, තේරීම් කාරක සභාව, ගෘහ්‍ය කාරක සභාව, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව සහ පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳ කාරක සභාව යන මේවායේ සභාපති ධුරයේ කටයුතු ද ඉටු කරන්නේය. කථානායකවරයා නොමැති අවස්ථාවක නියෝජ්‍ය කථානායකවරයා ද, ඒ දෙදෙනා ම නොමැති අවස්ථාවක නියෝජ්‍ය කාරක සභාපතිවරයා ද කථානායකවරයා වෙනුවෙන් කටයුතු කරයි. ඒ තිදෙනා ම නැති විටෙක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාවේ, (5) වන අනුව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව විසින් තෝරා ගනු ලබන මන්ත්‍රීවරයකු විසින් රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

එසේම පාර්ලිමේන්තුව පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාවක පවතින විට පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 87 අනුව, කතානායක, නියෝජ්‍ය කතානායක හා නියෝජ්‍ය කාරක සභාපතිත් නොමැති අවස්ථාවක දී සභාපති නාමාවලියේ මන්ත්‍රීවරයකු මූලාසනාරූඪ විය යුතු ය.

කථානායකවරයාගේ ප්‍රධාන රාජකාරි ඉටු කරනුයේ කථානායක අසුනේ සිටය. විවාද පැවැත්වෙන විට කැරෙන සියලු කතා කථානායකවරයා අමතා කරනු ලැබේ. තම නෙතට හසුවන කවර හෝ මන්ත්‍රීවරයෙකුට/වරියකට සිය කථාව අරඹන ලෙස ඔහු දන්වා සිටී. හදිසි පොදු කරුණක් හේතු කොට ගෙන විවාදයකට අනුමැතිය දිය යුතු දැයි ඔහු විසින් තීරණය කරනු ලැබේ. මන්ත්‍රීවරුන් විසින් මතු කරනු ලබන වරප්‍රසාද කඩවීම පිළිබඳ ප්‍රශ්න හා රීති ප්‍රශ්න පිළිබඳව තීන්දු දීම ඔහු අතින් ඉටු වෙයි. සභාව තුළ අසනු ලබන ප්‍රශ්න පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට යටත්ව අසනු ලබන බවට ඔහු සහතික වන අතර, අතිරේක ප්‍රශ්න ප්‍රධාන ප්‍රශ්නයේ විෂය පථයෙන් පරිබාහිර වන කල්හි ඒවා ප්‍රතික්ෂේප කරනු ද ලැබේ. කථා කරමින් සිටින මන්ත්‍රීවරයකුට බාධා කිරීමට හෝ තම කථාව නතර කරන ලෙස ඔහුට දැනුම් දීමට හෝ එතුමාට පුළුවන. නිසි වේලාවට සභාවේ වැඩ කටයුතු නතර කරනු ලබන බවට ඔහු වග බලා ගනියි.

විවාදයක උණුසුම් අවස්ථාවක පාවිච්චි වන වචන හෝ වාක්‍ය ඛණ්ඩ පාර්ලිමේන්තුවට නොගැලපෙන්නේදැයි තීරණය කිරීමට සභාවේ මුලසුන හොබවද්දී කථානායකවරයාට බොහෝ විට සිදුවෙයි. ඒවා නොගැලපෙන වචන නම් ඒ වරද කළ මන්ත්‍රීවරයාට ඒ වචන ඉල්ලා අස් කර ගන්නා ලෙස හෝ හැන්සාඩ් වාර්තාවෙන් ඒ වචන ඉවත් කරන ලෙස හෝ ඔහු නියෝග කරයි. ඇතැම් විට, කලබලකාරී අවස්ථාවක් මර්දනය කිරීමේ දේශපාලන උපක්‍රමයක් ලෙස, නොඇසුනා සේ සිටීමට ද කථානායකවරයාට සිදු වනු ඇත. සභාව දෙපාර්ශ්වයකට බෙදී ඡන්දය විමසන අවස්ථාවක දෙපාර්ශ්වයේම ඡන්ද සමාන වූ විටෙක මිස, කථානායකවරයා ඡන්දය දීමෙන් වැළකී සිටී. එවැනි අවස්ථාවක අදාළ ප්‍රශ්නය පිළිබඳ තීරණයක් ගැනීම සඳහා තීරක ඡන්දයක් පාවිච්චි කිරීමට කථානායකවරයාට හැකි නමුත්, පාර්ලිමේන්තු කටයුතුවලදී එවැනි අවස්ථා මතු වී ඇත්තේ ඉතා කලාතුරකිනි. කථානායකවරයා පාර්ලිමේන්තුවේ කථා නොපවත්වයි.

## පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, පාර්ලිමේන්තුවේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය ලේකම් හා කාර්ය මණ්ඩල සේවාවන්, පාර්ලිමේන්තු මහ ලේකම්වරයාගේ කාර්යාලය මඟින් ඉටු වේ. එය පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනත අනුව පත් කැරෙන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාව (SAC) යටතේ ක්‍රියාත්මක වන ස්වතන්ත්‍ර ආයතනයකි. කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාවට, කථානායකවරයා (සභාපති) සභානායකතුමා, විරුද්ධ පක්ෂයේ නායකතුමා හා මුදල් අමාත්‍යවරයා ද අයත් වෙති. පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය මූලික වශයෙන් දෙපාර්තමේන්තු අටක් යටතේ ක්‍රියාත්මක වේ. ඒවා නම්, වේත්‍රධාරී දෙපාර්තමේන්තුව, පරිපාලන දෙපාර්තමේන්තුව, හැන්සාඩ් දෙපාර්තමේන්තුව, සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ආහාරපාන හා ගෘහපාලන දෙපාර්තමේන්තුව, මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව, ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව සහ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව ද වෙයි.

## පාර්ලිමේන්තුවේ මහ ලේකම්

පාර්ලිමේන්තුවේ ස්ථිර නිල කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා වන මහ ලේකම්වරයා පත් කරනු ලබන්නේ පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණයට යටත්ව ජනාධිපතිවරයා විසිනි. එම තනතුර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා වී ඇති සුවිශේෂී තනතුරක් වන්නේ ය.

කථානායකවරයා සතු සියළු බලතල හා රාජකාරි මෙන්ම, කථානායකවරයා වෙතින් සභාවේ දී සිදු විය යුතු කටයුතු ක්‍රියාත්මක කිරීමේදී කථානායකවරයාට උපදෙස් දෙනු ලබන්නේ මහ ලේකම්වරයා විසිනි. රැස්වීම් පැවැත්වෙන වේලාවන්හි දී ඔහු සභා ගර්භය තුළ සිටිය යුතු වෙයි. කථානායකවරයාගේ අසුනට පහළින් පිහිටි අසුනෙහි ඔහු අසුන් ගෙන සිටින අතර, යම් කරුණක් පිළිබඳව උපදෙස් ලබා දීම සඳහා නිරතුරුවම ඔහු එහි රැඳී සිටියි. සාකච්ඡා පැවැත්වෙන අතරවාරයේ දී, කථානායකවරයාට සභාවේ රීති හා පූර්වාදර්ශවලට අදාළ නිර්වචනයන් ඇතුළත් නියෝග දීමට හෝ තීන්දු දීමට සිදුවන අතර, එවැනි අවස්ථාවල මහලේකම්වරයාගෙන් ලැබෙන උපදෙස් හෝ ඔහු පළකරන මතය අතිශයින් වැදගත් වෙයි. පාර්ලිමේන්තුවේ මහ ලේකම් පදවිය දැරීම නිසා ඔහු සියලු පාර්ලිමේන්තු කාරක සභාවල ලේකම් වශයෙන් ද, පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවේ ලේකම් හා භාණ්ඩාගාරික වශයෙන් ද, අන්තර් පාර්ලිමේන්තු සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවේ සම ලේකම් හා භාණ්ඩාගාරික වශයෙන් ද, නිල බලයෙන් කටයුතු කරයි. ඔහුගේ ඇතැම් පාර්ලිමේන්තුමය රාජකාරී පිළිබඳව ස්ථාවර නියෝගවල සඳහන් වන නමුත්, වෙනත් බොහෝ රාජකාරී ඉටු කරනුයේ පරිචය හා සම්ප්‍රදායානුකූලව ය.

පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය, මහ ලේකම්වරයා විසින් කථානායකවරයාගේ අනුමැතිය ඇතිව පත්කරනු ලැබේ. 2011 සේවක සංඛ්‍යාව අනුව ස්ථිර කාර්ය මණ්ඩලයට අනුයුක්ත මුළු ගණන 806කි. තවත් 200 දෙනෙක් සභා නායක කාර්යාලය, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය, විරුද්ධ පක්ෂ නායක කාර්යාලය, රජයේ විගණන අංශය, වෛද්‍ය මධ්‍යස්ථානය, විදුලි, විදුලි සංදේශ, රූපවාහිනී, ජල සැපයුම්, තැපැල් හා බැංකු සේවාව යනාදි සහාය සේවාවන්හි සේවයේ යෙදී සිටිති.

### වේත්‍රධාරි

පාර්ලිමේන්තු භූමිය තුළ නීතිය පවත්වාගෙන යන බවට වේත්‍රධාරී වගකිව යුතු අතර, සම්ප්‍රදායානුකූල කර්තව්‍යයන් ද ඔහු විසින් ඉටු කරනු ලබයි. ඔහු සෙංකෝලයේ භාරකරු මෙන්ම, සභාවේ නියෝග ක්‍රියාත්මක කරමින් කථානායකවරයාගේ අවශ්‍යතාවන් ඉටු කරලයි. අසිපතකින් සන්නද්ධව සභා ගැබේ හිඳීමට වේත්‍රධාරිවරයාට වරප්‍රසාදය හිමි වේ. ඔහු පාර්ලිමේන්තුවේ ආරක්ෂක කමිටුවේ ලේකම් හැටියට හා එහි සම්බන්ධීකරණය කිරීම භාරව සිටින අතර, පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට පුද්ගලයන් ඇතුළු කරවීම නියාමාකාරයෙන් සිදු වන බවට වග බලා ගනියි. පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් කථානායකවරයාගේ අනුමැතිය ඇතිව වේත්‍රධාරිවරයා පත් කරනු ලබන අතර, ඔහු වේත්‍රධාරි දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ද වේ. වේත්‍රධාරීවරයාගේ උපදෙස් පරිදි පාර්ලිමේන්තු පොලීසිය ක්‍රියා කරයි.

### පුස්තකාලය

විවිධ වූ විෂයයන් පිළිබඳව ලියැවුණු පොත්පත්වලින් සමන්විත පුස්තකාලයක් පාර්ලිමේන්තුවේ ඇති අතර, එය හුදෙක් මන්ත්‍රීවරුන්ගේ පරිහරණය සඳහා ම වෙන් වූවකි. පුස්තකාලයේ අන්තර්ගත පොත් තොගවලට, සාමාන්‍ය ස්වභාවයේ පොත්, සඟරා හා පුවත්පත් මෙන්ම නීතිය, දේශපාලනය, ආර්ථික විද්‍යාව, ඉතිහාසය හා සමාජ විද්‍යාව වැනි විෂයයන් පිළිබඳ කරුණු දැන ගතහැකි පොත්පත් ද ඇතුළත්ය.

නිබන්ධනවල එකතුව 25,000ක් පමණ වේ. සුරැකිව තබා ඇති ලිපි ලේඛනවලට පාර්ලිමේන්තු විවාද, පාර්ලිමේන්තු න්‍යාය පුස්තකය, න්‍යාය පත්‍ර, කාර්ය සටහන්, නෛතික ප්‍රඥප්ති, ශ්‍රී ලංකාවේ අණපනත් හා පනත් කෙටුම්පත්, රජයේ ගැසට් පත්‍ර, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා, සැසි වාර්තා, පරිපාලන වාර්තා හා වාර්ෂික වාර්තා ද ඇතුළත් ය. එසේම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා දීම්/ දිවුරුම් දීම්, විශේෂ කොමිෂන් සභා වාර්තා වැනි සුලභව ලබා ගත නොහැකි ලිපි ලේඛන හා පොත්පත් ද සුරක්ෂිතව තබා ඇත. ඒ අනුව පුස්තකාලයේ ඇති ලේඛනවල මුළු එකතුව 30,000ක් පමණ වේ. පුස්තකාලයේ පරිගණක පහසුකම් සපයා ඇති අතර, ග්‍රන්ථ සූචිය හා බැහැර දීමේ අංශය සම්පූර්ණයෙන්ම පරිගණක ගත කර ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ ජීවන තොරතුරු, පාර්ලිමේන්තු අත්පොත, ශ්‍රී ලංකාවේ පනත් වැනි විෂයයන් පිළිබඳ දත්ත සමුදායයන් ද (DATABASES) පුස්තකාලය විසින් පවත්වාගෙන යනු ලැබේ. මන්ත්‍රීවරුන් සඳහා අන්තර් ජාල ගවේෂණ ද පුස්තකාලය මගින් සිදු කරන අතර, විද්‍යුත් තැපැල් (ඊ මේල්) පහසුකම් ද සලසා ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිය දෛනික ලිපි එකතු කර ගන්නේ පුස්තකාලයෙනි. පුස්තකාලයේ පර්යේෂණ අංශය මගින් මන්ත්‍රීතුමන්ලාට අවශ්‍ය දත්ත සහිත තොරතුරු ලිපි සැකසීම සිදු කරයි.

### හැන්සාඩ් වාර්තාව

හැන්සාඩ් වාර්තාව යනු, ජනාධිපතිතුමාගෙන් ලත් සංදේශ, කථානායකතුමාගේ නිවේදන, මන්ත්‍රීවරුන් විසින් අසනු ලබන ප්‍රශ්න යනාදිය ද ඇතුළුව පාර්ලිමේන්තුවේ විවාද ඒ අයුරින්ම වාර්තා වන නිල වාර්තාව යි. මන්ත්‍රීවරුන් විවාදවල දී කරනු ලබන කථා, ඔවුන් කථා කරන භාෂාවෙන්ම (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) හැන්සාඩ් වාර්තාවෙහි සටහන් වෙයි. සභාවේ වැඩ කටයුතු ඒ අයුරින්ම වාර්තාවීම තත්කාලීන පාර්ලිමේන්තු ඉතිහාසය පිළිබඳව දැන ගත හැකි ඉතා සාරවත් මූලාශ්‍රයකි.

පුවත්පත්වල වාර්තා වනුයේ පාර්ලිමේන්තුවේ සිදුවන වැඩ කටයුතුවල සාරාංශය පමණක් වුවත් හැන්සාඩ් වාර්තාවෙන් පාර්ලිමේන්තුවේ සිදුවන සියලු කටයුතු පිළිබඳ නිල හා සවිස්තරාත්මක චිත්‍රයක් ඉදිරිපත් වේ. එය සභාවේ වැඩ කටයුතු පිළිබඳ ස්ථිර වාර්තාවක් වශයෙන් තිබීම හැරුණු විට මුද්‍රිත හැන්සාඩ් වාර්තා මහජන අලෙවිය සඳහා රජයේ ප්‍රකාශන කාර්යාංශයෙහි ද තබනු ලැබේ.



පුස්තකාලය

### ක්ෂණික කථා පරිවර්තනය

ස්ථාවර නියෝග ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ රැස්වීම් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පවත්වනු ලැබිය හැකිය. කිසියම් භාෂාවක් නොදන්නා මන්ත්‍රීවරුන්ගේ පහසුව තකා, එක භාෂාවකින් කරනු ලබන කථාවක් එකෙණෙහිම අනෙක් භාෂා දෙකට පරිවර්තනය කරනු ලැබේ. ඒ අනුව, පාර්ලිමේන්තුවේ කැරෙන කථාවලට තමාට කැමති භාෂාවෙන් සවන් දීමේ වරප්‍රසාදය මන්ත්‍රීවරුන් සතු වේ.

## පනත් කෙටුම්පතක් නීතිය බවට පත්වීම

### රජයේ පනත් කෙටුම්පත්

හැම පනත් කෙටුම්පතක්ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යටත් පිරිසෙයින් දවස් හතකට පෙර ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේ ය. අමාත්‍ය මණ්ඩලයේ ඇමැතිවරයෙකුට හෝ නියෝජ්‍ය ඇමතිවරයෙකුට හෝ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළ හැකි ය.

ස්ථාවර නියෝග අනුව දිනට නියමිත කටයුතු ආරම්භයේ දී මෙසේ ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පතේ "දීර්ඝ නාමය" මහලේකම් වරයා විසින් පාර්ලිමේන්තුවට කියවිය යුතු වේ. එය පළමුවර කියවීම වන අතර, පනත් කෙටුම්පත මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලද සේ සලකා එය ඉදිරිපත් කළ දිනයේ සිට සතියකින් පසු දිනයක් දෙවන වර කියවීම සඳහා නියම කර ගත යුතු ය.

අමාත්‍ය මණ්ඩලයේ අදහස් අනුව ජාතියේ හිත සුව පිණිස වහා අවශ්‍ය වන්නාවූ හදිසි පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා අග්‍රවිනිශ්චයකාරවරයා අමතා යවන ලිඛිත යොමු කිරීමකදී ඒ පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලද යන්න පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය පැය 24ක් ඇතුළත හෝ ජනාධිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දින 3ක් ඇතුළත ජනාධිපතිවරයාට සහ කථානායකවරයාට දැනුම්දිය යුත්තේය.

පළාත් සභාවලට අදාළ වන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන විටෙක ඒ ඒ පළාත් සභාවට එම පනත් කෙටුම්පත යොමු කොට එක් මසක කාලසීමාවක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලසීමාවක් තුළ දී හෝ එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පළාත් සභාවේ අදහස් පාර්ලිමේන්තුවට වාර්තා කරන ලෙස මහ ලේකම්වරයා විසින් ඉල්ලුම් කෙරේ. දී ඇති කාලසීමාව අවසන් වීම හෝ පළාත් සභාවල අදහස් ලැබීම යන මේ දෙකෙන් මුලින් එළඹෙන අවස්ථාවේ දී පාර්ලිමේන්තුව විසින් එම යෝජිත පනත් කෙටුම්පත දෙවන වර කියවීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

දෙවන වර කියවීමේ දී පනත් කෙටුම්පතේ පොදු ගුණාංග, ප්‍රතිපත්ති හා මූල ධර්ම ඇතුළත් විවාදයක් පැවැත්වේ. ඉන් පසු එය පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට යොමු කෙරේ. එහිදී පනත් කෙටුම්පතේ අඩංගු වගන්ති එකිනෙක ගෙන සාකච්ඡා කරමින් සංශෝධන ඇතොත් ඒවාද සලකා බලා "පනත් කෙටුම්පත දැන් සම්මත කළ යුතුය" යන යෝජනාව ඉදිරිපත් කිරීමෙන් පසු තුන්වන වර කියවා එම පනත් කෙටුම්පත සම්මත කර ගනී.

### පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්

යම් මන්ත්‍රීවරයෙකු පෞද්ගලික පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම් එහි ක්‍රියා පටිපාටිය මඳක් වෙනස් වේ. යම් විශේෂ පුද්ගලයෙකුට හෝ සමිතියකට හෝ නීතිගත සංස්ථාවකට බලපෑම සඳහා හෝ යහපතක් සැළසීම සඳහා යෝජනා කරනු ලබන පනත් කෙටුම්පතක් නම් එහි අරමුණු හා පරමාර්ථයන් පිළිබඳ ප්‍රකාශයක් සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහිත්, පිළිගත් ප්‍රවෘත්ති පත්‍රවලින් එක් භාෂාවකින්

එක් එක් පත්‍රයකවත් අදාළ මන්ත්‍රීවරයා විසින් ප්‍රසිද්ධකොට දැනුම්දිය යුතුවේ. මෙසේ පළ කිරීමෙන් එක් මසක කාලයකින් පසුව පනත් කෙටුම්පතේ අරමුණ හා මුඛ්‍යාංගයන් සඳහන් කරමින් එය ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තුවේ අවසරය යෝජනාවක් මගින් ඉල්ලමින් පනත් කෙටුම්පතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසියෙන් පිටපත් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාට භාරදිය යුතුය. ඔහු එම කෙටුම්පත භාෂාත්‍රයෙන්ම ගැසට් පත්‍රයේ පළ කර, දින 7ක් ඉක්ම ගිය පසු කවර හෝ දිනයක එකී පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අදාළ මන්ත්‍රීවරයාගේ යෝජනාව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබේ. නියමිත දිනයේ දී මන්ත්‍රීවරයා විසින් පනත් කෙටුම්පත සභාභිමුඛ කරනු ලැබ ඊට පාර්ලිමේන්තුවේ අවසරය දෙනු ලැබූ කල්හි එය පළමුවර කියවන ලද සේ සලකා මුද්‍රණය කිරීමට කටයුතු කර සාකච්ඡාවකින් තොරව පනත් කෙටුම්පත අදාළවන විෂය හා කාර්යය භාර ඇමතිවරයාට හෝ නියෝජ්‍ය ඇමතිවරයාට ඔහුගේ වාර්තාව ලබා ගැනීම සඳහා යොමු කෙරේ. සමසක් ඇතුළත එකී වාර්තාව ලැබීම හෝ නොලැබීම යන මේ දෙකින් මුලින් එළඹෙන අවස්ථාවේ දී පනත් කෙටුම්පත භාර මන්ත්‍රීවරයා කැමැති දිනයක එය දෙවන වර කියවීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබේ. මෙසේ නියමිත දිනට දෙවන වර කියවීමෙන් පසුව එම පනත් කෙටුම්පත කථානායකවරයා විසින් ස්ථාවර කාරක සභාවකට යොමු කරනු ලැබේ. එහිදී යෝජිත සියලුම වගන්ති පිළිබඳව සවිස්තරව අධ්‍යයනය කොට අවශ්‍ය සංශෝධන සමග එහි වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු කරනු ලැබේ. එහිදී එම වාර්තාව සලකාබලා තුන්වන වර කියවා එම පනත් කෙටුම්පත සම්මත කර ගනු ලැබේ.

**කථානායක සහතිකය**

ඉහත පරිදි සම්මත වූ පනත් කෙටුම්පත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව හැකි ඉක්මණින් කථානායකතුමාගේ සහතිකය සටහන් කළ පසු නීතිය බවට පත්වේ.

*ආශ්‍රිත ලිපි ලේඛන:*

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පාර්ලිමේන්තු ගොඩනැගිල්ල - ටී. වී. ගුණතිලක

කථානායක අසුන හා සෙංකෝලය - ටී. වී. ගුණතිලක

කථානායකවරයා හා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ ගැලරිවලට යන අමුත්තන් සඳහා උපදෙස්


**ජාතික කොඩිය**

ජාතික කොඩිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ කොටසකි. පාද තුනක් පොළොවේ තබාගෙන ඉදිරි එක් පාදයකින් අසිපතක් දරාගෙන ඉදිරිය බලා සිටින සිංහයා, වංශකථා අනුව සිංහයෙකුගෙන් පැවත එන සිංහලයන්ගේ ආරම්භය පෙන්නුම් කරයි. කෙළින් අතට තබා ගෙන සිටින කඩුවෙන් යුක්ති සහගත බව සංකේතවත් වේ. සිංහයාගේ හිස තෙක් උස්වන පරිදි දැක්වෙන වලිගය හා එහි හැඩය තුළින්, රට පාලනය කිරීමේදී පාලකයා සෑම පුරවැසියෙකුටම එක හා සමානව සැළකීම සංකේතවත් වේ. සිංහ හිසින් රජ හෝ පාලකයා සංකේතවත් වන අතර සිංහයාගේ කහ පැහැය සාමය සඳහා ඇති කැමැත්ත පෙන්නුම් කරයි. පසුබිමේ ඇති රතු පැහැය ජාතික අභිමානයේ සංකේතයි. කොන් හතරේ ඇති බෝ පත් හතර බුදු දහමෙහි අවධාරණය කෙරෙන මෙත්තා, කරුණා, මුදිතා සහ උපේක්ඛා නැතහොත් දයාව, කරුණාව, මෛත්‍රිය හා ඉවසීම පෙන්නුම් කරයි. කොඩිය සම චතුරස්‍රයක හැඩය ගන්නා අතර, පළලෙහි හා දිගෙහි අනුපාතය එකට දෙකකි. සිරස් අතට ඇති එක සමානව වූ කොළ පැහැ හා තැඹිලි පැහැ තීරු සුළු ජාතීන් නියෝජනය කරයි. සමස්ත කොඩියට සමානුපාතිකව මේ ඉරිවල ප්‍රමාණයේ අනුපාතය 1:1:5 කි. කොඩිය වටා කහ පැහැ වාටියක් ඇත.


## රාජ්‍ය ලාංඡනය


රාජ්‍ය ලාංඡනය, 1972 දී සංස්කෘතික අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද්දකි. සෞභාග්‍යය පෙන්නුම් කරන පුන් කලසක් ද, ධාර්මික බව පෙන්නුම් කරන ධර්ම චක්‍රයක් ද, ස්ථාවර බවේ සංකේත වන හිරු හා සඳු ද මේ ලාංඡනයෙහි දැක්වේ. ඉදිරි පාදයෙන් අසිපත ඔසොවා සිටින සිංහයා සහ නෙළුම් පෙති වාටියත් එයට ඇතුළත් වේ. මෙම නව ලාංඡනය පසුපස ඇති අදහස වනුයේ, හිරු සඳු පවතින තාක් කල් ධර්මිෂ්ඨ බව තුළින් රටේ සෞභාග්‍යය පවතිනු ඇත යන්නයි.

සිංහයා ගමන් කරනුයේ දකුණේ සිට වමටය. ඒ නිසා ලාංඡනය කියවිය යුත්තේ ද දකුණේ සිට වමටය. ඒ නිසාමය, හිරු දකුණේත් සඳු වමේත් සලකුණු කොට ඇත්තේ. සිංහයා, වමේ සිට දකුණට ගමන් කරනු දැක්වෙන්නේ නම්, හිරු වමේත් සඳු දකුණේත් සටහන් වී තිබිය යුතුය. දකුණේ සිට වමට කියවීම, පුරාණයේ සිට පැවති සිරිතක් බව ද මෙහි ලා සඳහන් කළ යුතු ය.









පාර්ලිමේන්තු රැස්වීම පටන් ගැනීමේ සීනුව නාද වීමෙන් පසුව "කතානායක පෙරහැර" සභා ගැබට පිවිසීම - සෙංකෝලය රැගත් වේත්‍රධාරී අනිල් සමරසේකර මහතා පෙරටු කොට ගරු කතානායක චමල් රාජපක්ෂ මහතා සභා ගැබට පැමිණේ. පසු පසින් පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික කිතුල්ගොඩ මහතාත්, නියෝජ්‍ය මහලේකම් ධම්මික දසනායක මහතාත්, සහකාර මහලේකම් නීල් ඉද්දවල මහතාත් ගමන් ගනී. එම් පසින් නියෝජ්‍ය වේත්‍රධාරි නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා කතානායකතුමා පැමිණෙන බව සභාවට හඬ නඟා දැනුම් දෙයි.

සෙංකෝලය නියමිත ස්ථානයේ තැබීමෙන් පසුව කථානායකතුමා සභාවේ මුලසුන හොබවයි. පහත අසුනේ සිටින මහලේකම් මණ්ඩලය සභාවේ කටයුතු නිසි අයුරින් පවත්වාගෙන යාමට උපකාරී වේ.


පළමු මුද්‍රණය : 2001

දෙවන මුද්‍රණය : 2011 ජූනි

යාවත්කාලීන කිරීම : 2019 නොවැම්බර්

ISBN : 955-8412-04-x

සම්පාදක : සී. කුරුප්පු

ඡායාරූප : නුවන් දුමින්ද

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව